මිනිසා අතහැර විසඳුමක් නැත P 16

THE CHATHAM STREET JOURNAL

Trust your source. Trust your decisions.

2023 | 10 | 15 Vol: 58



## ජීවිතවලට ලංසු තියන ගංවතුරේ දේශපාලනය

P 04



## සමූහ මිනී වළක අපේක්ෂාව පමණක් ඉතිරිකර ඇත

P 06



## ඇඳුම බලල බදු නොගහන ක්‍රමයක්

P 08



# The old world has gone But don't worry We are already in the future

'පරණ ලෝකය අවසන්ය, ඒත් දුක් වෙන්න එපා, අපි දැනටමත් අනාගතයේ සිටිමු.'

අනාගතයේ නව ලෝකයක් නැතිනම් නව රටක් ගැන අපේක්ෂාව ශ්‍රී ලංකිකයන් කෙරෙහි තදින්ම බැඳී ඇත්තකි. එහෙත් පැරණි දේ මිය යමින් පවතින අතර අලුත් දේ ජනිත කිරීමට නොහැකිවීම වන්නේ නම් එය අර්බුදයකි. මේ අර්බුද කාලය කියන්නේ සංක්‍රාන්තික කාලයකි, එමෙන්ම අනතුරු සහිතය. අද ලෝකයත් රටත් ගෙවමින් සිටින්නේ මේ සංක්‍රාන්තික කාලයකි. නමුත් එය අනාගතය වෙනුවෙන් ජය ගත යුතුය. අභියෝගය එයය.

ජනාධිපති රනිල් වික්‍රමසිංහ පසුගිය 12 වෙනිදා "ගාලු කතිකාව 2023" සමුළුවට එක්වෙමින් කළ දේශනයෙහි සාරාංශය මෙබඳුය. මෙහිදී ජනාධිපතිවරයා භූ දේශපාලනික කරුණු රැසක් ඉදිරිපත් කළේ සුවිශේෂී ඉන්දියානු සාගර කලාපීය පිළිවෙලක් **(New Order in the Indian Ocean)** නිර්මාණය කිරීම වෙනුවෙන් වන අභිප්‍රායෙහි වැදගත්කම මතු කරමිනි. එමෙන්ම ශ්‍රී ලංකාවට එහි ඇති

P 02

# නසීර්ගේ තීන්දුව හා ඇඟිල්ල දෙස බැලූ විපක්ෂය



ශ්‍රී ලංකා දේශපාලන ඉතිහාසයේ පිල්මාරුවීම්, පක්ෂයෙන් නෙරපීම්, පක්ෂය තහනම් කිරීම් වැනි කාරණා අඩුවක් නොමැතිව පැවතිණි. ඒ ඒ දේශපාලන පක්ෂයන්හි ව්‍යවස්ථානුකූලව පවතින ප්‍රතිපත්ති මත පදනම්ව හෝ පාර්ලිමේන්තු ව්‍යවස්ථාවන්ට අනුකූල නොවන තැනකදී හෝ එක්කෝ පක්ෂයෙන් නෙරපීම්ද නැතහොත් ව්‍යවස්ථා උල්ලංඝණයවීමක් නම් පාර්ලිමේන්තු මන්ත්‍රී ධූරය අවලංගු කිරීම්ද සිදුකොට ඇත. මේ කතා බහට මූලික වන්නේ පසුගියදා මුස්ලිම් කොංග්‍රසයේ මන්ත්‍රීවරයකු ලෙස තේරී පත්ව, ආණ්ඩුවට එක්ව පරිසර ඇමැති ධූරය ද හොබවන නසීර් අහමඩ් පක්ෂයෙන් නෙරපා දැමීමට එම පක්ෂයේම උත්තරීතර මණ්ඩලය විසින් ගන්නා ලද තීරණය තහවුරු කරමින්, එය නිවැරදි බවට ශ්‍රේෂ්ඨාධිකරණය නිගමනය කිරීමත් සමඟය. ඒ සමඟ ඔහුගේ මන්ත්‍රී ධූරය අහෝසි විය.

අදාළ නඩු විභාගය සම්බන්ධයෙන් වන සාරාංශය මෙසේය, 2021 වසරේ නොවැම්බර් මස 12 වනදා මුදල් අමාත්‍යවරයා විසින් 2022 වසර සඳහා වන විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේය.

මෙම විසර්ජන පනත් කෙටුම්පත් විවාදයේ දී පක්ෂයේ මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ආකාරයේ තීරණය කිරීම සඳහා 2021 වසරේ නොවැම්බර් මස 22 වනදා ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ උත්තරීතර මණ්ඩලයේ හදිසි රැස්වීමක් පැවැත් වූ අතර එම රැස්වීමේ දී අදාළ පනත් කෙටුම්පතට පක්ෂව ඡන්දය නොදීමට උත්තරීතර මණ්ඩලය විසින් තීරණය කොට තිබිණි.

අවශ්‍ය නම් පනතට විරුද්ධව ඡන්දය දීමට හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීමට හැකියාව තිබෙන බවත් උත්තරීතර මණ්ඩලය එහිදී වැඩි දුරටත් තීන්දු කර තිබිණි. එහෙත් නසීර් අහමඩ් මන්ත්‍රීවරයා පක්ෂයේ උත්තරීතර මණ්ඩලයේ තීන්දුවට පිටුපාමින් විසර්ජන පනත් කෙටුම්පතට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළේය.

පසුව, පක්ෂයේ විනය කඩ කිරීම සම්බන්ධයෙන් කරුණු විමසා පක්ෂ මහලේකම්වරයා විසින් මන්ත්‍රීවරයාට ලිපි යොමු කළ අතර, ඊට හේතු පැහැදිලි කිරීමක් සිදු කර තිබුණේ නැත. පසුව 2022 වසරේ අප්‍රේල් මස 23 වනදා ඔහුගේ පක්ෂ සාමාජිකත්වය නෙරපමින් ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ මහලේකම් නිසාම් කාරියප්පර් විසින් ලිපියක් නිකුත් කළේය.

මේ සම්බන්ධයෙන් නසීර් අහමඩ් විසින් කිසිදු සාධාරණ පරීක්ෂණයකින් තොරව තම පක්ෂ සාමාජිකත්වය අහිමි කිරීමට ක්‍රියා කොට ඇති බව දන්වා ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය ගත් තීරණය නීතියට පටහැනි බවට තීන්දුවක් ලබාදෙන ලෙස ඉල්ලා ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කරණු ලැබීය.

එහෙත්, පක්ෂයේ උත්තරීතර මණ්ඩලය විසින් ගනු ලැබූ තීන්දුවලට පටහැනිව ක්‍රියාකරී කිරීම තුළින් පෙත්සම්කරු එම ප්‍රතිඥාව උල්ලංඝනය කර තිබෙනවා පමණක් නොව එසේ කටයුතු කිරීම සම්බන්ධයෙන් හේතු පැහැදිලි කිරීමෙන් පවා වැළකී තිබෙන බවත් විනිසුරුවරු තීන්දුවේ සදහන් කළේය.

ඉදිරිපත් වූ කරුණු සලකා බැලීමේ දී පෙත්සම්කරු පක්ෂ සාමාජිකත්වයෙන් නෙරපමින් එම පක්ෂ මහලේකම්වරයා විසින් නිකුත් කළ ලිපිය නීත්‍යානුකූල යැ යි තීන්දු කරන බවත් ප්‍රීති පද්මන් සූරසේන, එස්. තුරෛරාජා සහ මහින්ද සමයවර්ධනගෙන් සමන්විත ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ල විසින් නිකුත් කළ තීන්දුවේ සදහන් විය. මේ අනුව විනිසුරු මඩුල්ල විසින් පෙත්සම්කරුගේ පක්ෂ සාමාජිකත්වය අහිමි කරමින් එම පක්ෂයේ මහ ලේකම්වරයා විසින් නිකුත් කර තිබෙන ලිපියේ කටයුතුවලට මැදිහත් වීමට තරම් අධිකරණයට සාධාරණ කරුණු කිසිවක් අනාවරණය නොවන බව සඳහන් කර පෙත්සම්කරුගේ ඉල්ලීම නිෂ්ප්‍රභ කරන බව තීන්දුවේ සඳහන් කර කොට ඇත. මේ අනුව පක්ෂයෙන් නෙරපීම හා නසීර් අහමඩ් දැරූ පාර්ලිමේන්තු මන්ත්‍රී ධූරයෙන් ඉවත් කිරීම මුස්ලිම් කොන්ග්‍රසය විසින් සිදු කිරීම සාධාරණ බව අධිකරණය විසින් තීන්දු කළේය.

මුස්ලිම් කොන්ග්‍රසය වේවා වෙනත් පක්ෂයක් වේවා ඒ ඒ පක්ෂයන්ට අදාළ සම්මතකර ගත් ප්‍රතිපත්තීන් ඇත. පක්ෂ සාමාජිකත්වය ඊට අනුගත විය යුතුය. මේ නිසාම පුද්ගලික තීරණය පක්ෂයේ තීරණ නොවන්නේ බහුතරයකින් එය පක්ෂය සම්මත කරගැනීමක් නොවීම හේතුවෙනි. නසීර් අහමඩ්ගේ පුද්ගලික තීරණයට පක්ෂ ප්‍රතිපත්තිය බලපැවැත්වෙන්නේ ඒ අනුවය.

මෙය මූලික කොටගෙන දේශපාලනයේ ඇති වූ සාකච්ඡාව සමාජය තුළ ප්‍රචලිත වූයේ මෙවැනි තීන්දු ගැනීම ප්‍රතිපත්තිමය ලෙස දේශපාලනයේ හැරවුම් ලක්ෂයක් ලෙස දක්වමිනි. නමුත් විපක්ෂය එය එසේ අර්ථ ගන්වනුයේම එය වෙනකක් නිසා නොව එමගින් පක්ෂ සෝදාපාළු නොවීමට බාධකයක් වෙතැයි කල්පනා කිරීමත්, තම මන්ත්‍රීන් එක්කරගෙන වන බහුපක්ෂ ආණ්ඩුව විසින් ගෙන යන වැඩපිළිවෙල කඩාකප්පල් වීමට මෙය රුකුලක් වීම හේතු කොටගෙනය.

එහෙත් ඇතැම් විට මේ පිල්මාරුවීම් සිදුවන්නේ බලය අහිමිව සිටිනවාට වඩා බලයේ සිටින පක්ෂය තුළට සහයෝගය දැක්වීමෙන් ජනතාව තමන්ව පත් කළ අරමුණු මුදුන්පත් කරගැනීමේ අරමුණද පෙරදැරිවය. හෘද සාක්ෂිය අනුව තීන්දු ගැනීමේ හැකියාව මන්ත්‍රීවරුන්ට තිබිය යුතු යැයි මේ අයගේ ජනප්‍රිය කතාවකි. මේ අනුව පක්ෂ මාරුව නැතහොත් පිල් මාරුව යනු ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක් බව ඒ බොහෝ දෙනා සලකති. එහෙත් එය භාවිත කළ යුත්තේ, ලාභ ප්‍රතිලාභ වරප්‍රසාද වෙනුවෙන් නොව ප්‍රතිපත්ති මත පදනම්ව ය.

එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක 1952 දී එජාපයෙන් විපක්ෂයට ගියේය. පසුව 1964 දී සිරිමා බණ්ඩාරනායකගේ රජය පෙරළා දමන ලද්දේත් එම පක්ෂයේ ම සිටි සී.පී. ද සිල්වා ප්‍රමුඛ කණ්ඩායමක් පක්ෂයෙන් ඉවත්වීමෙන් බව ඉතිහාසයේ සඳහන් වේ. සමගි පෙරමුණ ලෙස වමේ සහාය ද සමඟ අගමැති ධූරයට පත්වූ සිරිමාවෝට 1975 දී සමසමාජය ආණ්ඩුවෙන් නෙරපා දැමූ පසු තම පක්ෂයේ තවත් පිරිසක් ඉවත්වීමේ ගැටළුවට මුහුණ දීමට සිදු විය.

ආර්. ප්‍රේමදාස ආණ්ඩුවෙන් විශාල පිරිසක් වෙනත් පක්ෂ ගොඩ නගා ගනිමින් හා ශ්‍රී ලං.නි.ප.යට එකතුවෙමින් ද මේ පිල්මාරුව සිදු කළේය. ලලිත් ඇතුලත්මුදලි, ගාමිණී දිසානායක හා ප්‍රේමචන්ද්‍ර ඇතුළ පිරිසක් ඉවත්වීම මෙහිලා සුවිශේෂී වේ. ඔවුන් විසින් ප්‍රේමදාස මහතාට එරෙහිව දෝෂාභියෝගයක් ගෙන ඒමට පවා ක්‍රියා කළ අතර පසුව රාජාලියා සලකුණ යටතේ පක්ෂයක් පිහිටුවීමට කටයුතු කළේය.

මින් පසුව පිල්මාරුවීම් වැඩි වශයෙන් දක්නට ලැබුනේ චන්ද්‍රිකා බණ්ඩාරනායක පාලනයේ අවසාන කාලයේදීය. මේ පිරිස් එජාපයට එක්ව එහි මූලික තනතුරුවලට පවා පත්විය. පරිවාස ආණ්ඩු ගොඩනැගීම දක්වා දේශපාලන අස්ථාවරත්වයන්ට ලංකාවේ දේශපාලනය වෙනස් කිරීමට හේතු වූයේද පක්ෂ මාරු කිරීමේ ක්‍රියාවලියය.

මහින්ද රාජපක්ෂ පාලන කාලය තුළ ඒ පැත්තෙන් මේ පැත්තටත් මේ පැත්තෙන් ඒ පැත්තටත් ගමන් කළ පිරිස් විශාල ප්‍රමාණයක් විය. මේ තත්වය එවක ජනතාව අතර ප්‍රචලිත වූයේ යම් මන්ත්‍රීවරයෙකුගේ නම සදහන් කළ හොත් ඔහු ඉන්නා පක්ෂය කුමක්ද යන්න කියාගැනීමට නොහැකි වන තරමට පක්ෂ මාරුවීම් උඩුදුවා තිබුණි.

කෙසේ නමුත් මෙය දේශපාලනිකව සාධනීය ලක්ෂණයක් නොවන නමුත් ලංකාව වැනි ප්‍රාථමික ප්‍රජාතන්ත්‍රවාදී රටක් තුළ දේශපාලනයේ සිදුවිය හැකි සාමාන්‍ය ලක්ෂණයක් දක්වා වර්ධනය වීම ප්‍රජාතන්ත්‍රීය රාජ්‍ය පාලනයකට සුබවාදී දෙයක් නොවේ. මෙහිදී මුදලට, ඇමැති වරප්‍රසාද වරදානවලට, තමන්ට ඇති අපරාධ චෝදනාවකින් නිදහස්වීමට පිල් මාරුකිරීම සුලබ වීම ගැටළු සහගත විය. මේ තත්වය මත පිල් මාරුව වැලැක්වීම වෙනුවෙන නීති පැනවිය යුතු බවට කතිකාවක් සමාජය තුළ ඇතිව තිබිණි.

නසීර් අහමඩ්ගේ තීන්දුව සම්බන්ධයෙන් උත්කර්ෂයට නංවමින් ඇතැම් විපක්ෂයේ මහත්වරු ස්තෝත්‍ර ගායනා කළද පක්ෂ මාරු කිරීම වලක්වාලීමට පසුගියදා නීති සම්පාදනය කොට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ විට ඊට විරෝධය දක්වා එය ඉවත් කරගැනීමට තරම් මේ අය සමත්ව තිබිණි. ඒ අනුව දැන් මේ රඟපානුයේ ප්‍රජාතන්ත්‍රවාදය පිහිටුවා රටේ දේශපාලන සංස්කෘතිය ගොඩ නැගීමට නොවන බවත් පැහැදිලිය. කොහොම නමුත් අධිකරණ තීන්දුව අදාල මන්ත්‍රීවරයාට පමණක් වලංගු තීරණයක් මිස පොදුවේ පක්ෂ මාරුව නීති විරෝධී බවට දුන් තීන්දුවක් නොවේ. මේ අනුව පක්ෂ මාරුකිරීම තහනම් කරන නීති සම්මතයක් වෙනුවෙන් පාර්ලිමේන්තුවම අත උස්සනවා නම් ඒ ප්‍රජාතන්ත්‍රවාදයේ ජයග්‍රහණයක් ලෙස සැමරිය හැකි වෙනු ඇත. නමුත් එයට මන්ත්‍රීවරු කැමැති වීම අවිනිෂ්චිතය. මේ නිසා විපක්ෂය, පක්ෂ මාරුව ගැන ජනතාවට තේරුම් කර දෙන්න යන්නේ සඳ පෙන්වූ විට ඇඟිල්ල දෙස බලා කරන විග්‍රහයකට වඩා නොදෙවෙනි ලෙස බව පැහැදිලිය.

**කේ.පී.අයි. ප්‍රියංගනී**

---

# The old world has gone
# But don't worry We are already in the future

පරණ ලෝකය අවසන්ය, ඒත් දුක් වෙන්න එපා, අපි දැනටමත් අනාගතයේ සිටිමු.

අනාගතයේ නව ලෝකයක් නැතිනම් නව රටක් ගැන අපේක්ෂාව ශ්‍රී ලංකිකයන් කෙරෙහි තදින්ම බැඳී ඇත්තකි. එහෙත් පැරණි දේ මිය යමින් පවතින අතර අලුත් දේ ජනිත කිරීමට නොහැකිවීම වන්නේ නම් එය අර්බුදයකි. මේ අර්බුද කාලය කියන්නේ සංක්‍රාන්තික කාලයකි, එමෙන්ම අනතුරු සහිතය. අද ලෝකයත් රටත් ගෙවමින් සිටින්නේ මේ සංක්‍රාන්තික කාලයකි. නමුත් එය අනාගතය වෙනුවෙන් ජය ගත යුතුය. අභියෝගය එයය.

ජනාධිපති රනිල් වික්‍රමසිංහ පසුගිය 12 වෙනිදා "**ගාලු කතිකාව 2023**" සමුළුවට එක්වෙමින් කළ දේශනයෙහි සාරාංශය මෙබඳුය. මෙහිදී ජනාධිපතිවරයා භූ දේශපාලනික කරුණු රැසක් ඉදිරිපත් කළේ සුවිශේෂී ඉන්දියානු සාගර කලාපීය පිළිවෙලක් (New Order in the Indian Ocean) නිර්මාණය කිරීම වෙනුවෙන් වන අභිප්‍රායෙහි වැදගත්කම මතු කරමිනි. එමෙන්ම ශ්‍රී ලංකාවට එහි ඇති කොටස ගැනත් පෙන්වා දෙමිණි. මේ වන විට පවතින ලෝක පිළිවෙල (World Order) බටහිර හෝ චීනය හෝ කුමක් කේන්ද්‍ර කරගෙන පැවතියත් එය ගොඩනැංවීම් යුගයන්ගේ වර්ධනයන් මඟින් ක්‍රමයෙන් වෙනස් වෙමින් හෝ අවසන් වෙමින් හෝ තිබේ. නමුත් විශේෂයෙන්ම ඉන්දීය සාගර කලාපීය නව භූ-දේශපාලනික පිළිවෙල එලෙස වෙනස් නොවන්නක් බවද එය ලෝකයේ අනාගතයේ විශාල පංගුවත් අත්පත් කරගැනීමට නියමිත බවටද ජනාධිපතිවරයා හේතු සාධක ඇතිව කරුණු දැක්වීය.

ලෝකයේ විවිධ රාජ්‍යයන් ආර්ථිකමය හෝ වේවා ආරක්ෂාව වෙනුවෙන් හෝ වේවා සංවිධානගත වූ බලකේන්ද්‍රයන් ගොඩනගා ඇති නමුත් මේ ගොඩනැගීම් තාවකාලිකය. නමුත් ඊට විකල්පව ඉන්දීය සාගර කලාපීය පිළිවෙල එවැනි තාවකාලික ගොඩනැංවීමක් නොවන්න හේතු තිබේ. ඒ මන්ද යත් මෙම ඉන්දීය සාගර කලාපය යනු ශිෂ්ඨාචාරයක් වීමත් එය දේශපාලනික වශයෙන් අනෙක් බල කේන්ද්‍රයන්ගෙන් වෙනස් වීමත් නිසාය. ජනාධිපතිවරයා එය පෙන්වා දුන්නේ කරුණු සහිතවය. එම නිසා එය විනාශ නොවන, විනාශ කළ නොහැකි සුවිශේෂී ගොඩනැංවීමක් බවත් අවධාරණය කළේය.

කෙසේ නමුත් අද ඉන්දියානු සාගර කලාපීය පිළිවෙල ගොඩනැංවීමෙහි ප්‍රමුඛ වගකීම ශ්‍රී ලංකාවේ උරමත තිබේ. ඉන්දියානු සාගර වටද්දර සංගමයේ සභාපතීත්වය ශ්‍රී ලංකාවට දෙවසරක් කාලයක් සඳහා හිමිව තිබීම තුළ මෙම කලාපීය ගොඩනැංවීමෙහි නායකත්ව මෙහෙයුම ජනාධිපති රනිල් වික්‍රමසිංහගේ වගකීම වී ඇත. මෙය රනිල් වික්‍රමසිංහගේ මීට දශක කිහිපයකට පෙර සිටම සාකච්ඡා කළ, සැලසුම් කළ, ක්‍රියාවට නඟමින් සිටි වැඩපිළිවෙලකි. ශ්‍රී ලංකාවේ අනාගත අපේක්ෂාවන් කුළු ගැන්වෙනු ඇත්තේත් මේ වැඩපිළිවෙල මතය. තවත් ලෙසකින් කිවහොත්, ජනාධිපතිවරයා ශ්‍රී ලංකාව මේ වන විටත් අනාගතයට ගෙන ගොස් ඇති බවය.

# විපක්ෂයේ දේශපාලනයටත් ප්‍රතිපත්ති තිබිය යුතුය




ශ්‍රී ලංකාවේ දේශපාලනය තුළ ප්‍රතිපත්ති මුල් කරගත් දේශපාලන ක්‍රියාකාරීත්වය යන්න විහිළුවක් බවට පත්ව තිබෙන බව අමුතු කතාවක් නොවේ. එතැනින් රනිල් වික්‍රමසිංහ වැනි අය වෙනස් වුවත් පොදු තත්වය එලෙසමය. මේ දිනවල විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමක් ගැන පළවන වාර්තා අනුව යළි විධායක ධුරය ගැන ප්‍රතිපත්තිය සාකච්ඡා කිරීමට පසුබිමක් සලසා දී ඇත. විධායක ජනාධිපති ධුරය එක්සත් ජාතික පක්ෂයේ හිටපු නායක ජේ.ආර්. ජයවර්ධන විසින් 1978 ව්‍යවස්ථාව ගෙන එමින් මෙරටට හඳුන්වා දුන්නේ ඒ වන විට පැවැති සමගි පෙරමුණු පාලනය විසින් පවත්වගෙන ගිය සංවෘත සහ සමාජවාදී කඳවුරට පක්ෂපාත යල්පැන ගිය ආර්ථික පිළිවෙත නිසා රට ආර්ථිකමය වශයෙන් කඩා වැටීමත්, ජාත්‍යන්තරයට සමගාමී සංවර්ධනයක් අත්පත් කරගැනීමට තිබූ අවස්ථාවන් අහෝසි කරගැනීම නිසා රට තවදුරටත් දුප්පත් දූපත් රාජ්‍යයක් ලෙස පැවැතීමත් ආදී අයහපත් තත්වයන් වෙනස් කර සීඝ්‍ර ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙලක් හරහා රට නගා සිටුවීම වෙනුවෙනි. ජේ.ආර්. ජයවර්ධනට එවැනි අවංක වැඩපිළිවෙලක් තුළ කටයුතු කිරීම වෙනුවෙන් විධායක බලය සහිත පාලන ව්‍යුහයක් අවශ්‍ය විය. ඔහු ඒ තුළ මෙරට ආර්ථික විප්ලවයකට මඟ පෑදීම සිදු කළේය. එහෙත් එජාපය හැර සියලුම පක්ෂ පාහේ එදා පෙනී සිටියේ මෙම තනතුර අහෝසි කිරීම වෙනුවෙනි. ඊට හේතු සාධක බොහොමයක් තිබිණි. මෙහිදී වැදගත්ම කාරණය වූයේ මෙම තනතුරට පිස්සෙක් මෝඩයෙක් ජාවාරම්කාරයෙක් වැනි පත්වීමකට මෙරට ක්‍රියාත්මක මැතිවරණ ක්‍රමය යටතේ හැකියාව තිබීම මගින් රට විශාල අනතුරක වැටීමේ ඉහළ සම්භාවිතාවක් විවරව තිබීමය. කෙසේ නමුත් එදා ඒ පෙන්වා දුන් කරුණු අනුවම මෙම විධායක ජනාධිපති ධුරය නුසුදුස්සන් අතට යෑම නිසාම විශාල විනාශයක් කරගත්තේය. රට බංකොලොත්වීම ද එලෙස සිදුවුණු බව පසුගිය ගෝඨා පාලනය විසින් හොඳටම ඔප්පු කර තිබිණි.

ඒ කොහොම නමුත් විධායක ජනාධිපති ධුරය වෙනුවෙන් ජනාධිපතිවරණ පැවැත්වූ සෑම අවස්ථාවක්ම පාහේ මෙම විරුද්ධ වූ කොටස් ජනාධිපති අපේක්ෂකයකු ඉදිරිපත් කිරීම හෝ අපේක්ෂකයකු වෙනුවෙන් සහය පළ කිරීමක් හෝ කර ඇත. එමෙන්ම විධායකය අහෝසි කරන්නේමැයි කියමින් තරග කළ අයද හැම ජනාධිපතිවරණයකම සිටියේය. එසේ තරග කර ජයග්‍රහණය කළ අයද පොරොන්දුව විසිකර දමා මෙම තනතුරේ බලය හිතේ හැටියට පාවිච්චි කළේය.

මෙරට ජනාධිපතිවරුන් වූ චන්ද්‍රිකා බණ්ඩාරනායක, මහින්ද රාජපක්ෂ, මෛත්‍රීපාල සිරිසේන තමන්ගේ මැතිවරණ සටන් පාඨයක් ලෙස විධායකය අහෝසි කිරීම ප්‍රමුඛ කරගත් අය වේ. නමුත් අඩුම තරමින් විධායකයේ බලතල හෝ අඩු කිරීමට පියවර ගෙන තිබුණේ මෛත්‍රීපාල සිරිසේන විසින් පමණි. මහින්ද රාජපක්ෂ 18 වන ව්‍යවස්ථා සංශෝධනය ගෙන එමින් සිය බලතල වැඩිකර ගැනීමටද කටයුතු කළේය. මෛත්‍රීපාල 19 වැනි සංශෝධයෙන් එම බලතල අඩු කරගත් නමුදු නැවත ගෝඨාභය විසින් එය පවරා ගනු ලැබුවේ 20 වන සංශෝධනය ගෙන එමිනි. කෙසේ නමුත් සර්ව බලධාරිත්වයක් තිබූ නමුත් ගෝඨාභයව එම තනතුරෙන් පහ කිරීමට ව්‍යවස්ථානුකූල පිළිවෙත උල්ලංඝනය කර හෝ මහජන බලයට හැකි වීමත් මේ විධායක ජනාධිපති ධුර ඉතිහාසයේ සුවිශේෂී අවස්ථාවකි. එහි තේරුම නම් ඍජු මහජන බලය හමුවේ මෙම විධායක තනතුරත් ඊට යටත් බවය. කොහොමත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පනවා ඇත්තේත් ජනතාවගේ විධායක බලය මෙම තනතුරෙන් මූර්තිමත් වන බවටය. එය පාලකයා විසින් අමතක කිරීම මෙම තනතුරට පත්වූ බොහෝ දෙනෙකුට සිදුව තිබිණි. වැරදි භාවිතාවන්ට ජනාධිපතිවරු යොමු වූයේ ඒ අනුවය.

ගෝඨාභයගෙන් පසුව අනුප්‍රාප්තික ජනාධිපතිවරයා වූ රනිල් වික්‍රමසිංහ 21 වැනි සංශෝධනය ගෙන එමින් ඒ මොහොත පාර්ලිමේන්තුව මඟින් අනුමත කළ හැකිව තිබූ යම් බලතල ප්‍රමාණයක් අඩු කරගැනීම සිදු කළ අතර විධායකයට හිමි තවත් බලතල ගණනාවක් පසෙක තබා රජයේ කටයුතු සම්බන්ධයෙන් තීන්දු තීරණ ගැනීමේ බලය පාර්ලිමේන්තුවට පවරාදීමටද කටයුතු කර ඇත. විශේෂයෙන්ම මෙහිදී විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ සහ අමාත්‍යධුර නොදරන පසුපෙල මන්ත්‍රීවරුන්ගේ සහයද ආණ්ඩුකරණය සඳහා සම්බන්ධ කරවීම වෙනුවෙන් දියුණු ක්‍රියාමාර්ග රැසක් ගෙන තිබේ. ඒ තබා පාර්ලිමේන්තුව නියෝජනය කරන උගත් තරුණ ප්‍රජාවටද ආංශික කාරක සභා හරහා ආණ්ඩුකරණයට සම්බන්ධකරවීමට කටයුතු කර ඇත. එසේම මේ වන විට කෙටුම්පත් කර ඇති ජනසභා ක්‍රමය මඟින්ද රටේ සාමාන්‍ය ජනතාව ආණ්ඩුකරණයට සහභාගි කරවීමේ ක්‍රියාමාර්ගයන් සකස් කරමින් ඇත.

තනි පුද්ගලයකුගේ විධායක බලයකින් රාජ්‍ය පාලනය කිරීමේ හැකියාව 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ප්‍රතිපාදන සලසා ඇතත් ජනාධිපති රනිල් එම බලයත් විමධ්‍යගත කරමින් බහුතරයේ අදහස අනුව ආණ්ඩුකරණය වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදයකට හැරවීම ප්‍රතිපත්තියක් වශයෙන් පිළිගෙන තිබෙන බවත් ඔහු ඊට අවශ්‍ය තරමේ ආදර්ශයන් සපයමින් පෙන්වා තිබෙන බවත් පැහැදිලිය. ඔහු විධායක ජනාධිපති ධුරය අහෝසි කර පාර්ලිමේන්තු ක්‍රමය පිහිටුවීම වෙනුවෙන් කාලයක් පුරා පෙනී සිටින්නෙකි. පසුගිය යහපාලන යුගයේදී ද ඒ වෙනුවෙන් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමට පුළුල් සාකච්ඡාවක් ඇති කර යෝජනා රැසක් කෙටුම්පත් කිරීමටද පියවර ගෙන තිබිණි. ඒ අනුව ජනාධිපතිවරයාගේ අපේක්ෂාව වන්නේ අද රටට නොගැලපෙන විධායක බලැති තනි පුද්ගලයකුගේ පාලනයට වෙනස්කර නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් මඟින් අද තිබෙන දේශපාලනික අවුල් වියවුල් භාවය වෙනස් කර වඩා ප්‍රජාතන්ත්‍රවාදී, රටට වඩාත් හිතකර යෝජනාවක් ක්‍රියාවට නැගීමය. ඒ ඔහුගේ නොවෙනස් ප්‍රතිපත්තිමය දේශපාලන භාවිතයයි. ඒ අනුව රට මුහුණ දෙමින් තිබෙන ආර්ථික අර්බුදයන් පිළිසකර කර රට යම් ස්ථාවරත්වයකට පත් කිරීමෙන් පසුව ඒ නිසි මොහොතේදී එම දේශපාලන ප්‍රතිසංස්කරණයන් වෙත යොමු වීම සිදු වෙනු ඇතැයි කල්පනා කළ හැකිය.

කෙසේ නමුත් මේ වන විට විධායකය අහෝසි කිරීමේ කසු කුසුව තුළ ආණ්ඩුව හෝ ජනාධිපතිවරයා ගන්නා ක්‍රියාමාර්ග ගැන හෝ හරි හමන් මතයක් පැහැදිලිව පළ වී නැති අවස්ථාවක වුවත් විධායකය අහෝසි කිරීම වෙනුවෙන් පෙර යුගවල පෙනී සිටි අයද විධායකය අහෝසි කිරීමට ඉඩ නොදෙන ප්‍රතිපත්තියට මාරු වී සිටිනු දකින්නට තිබේ.

විශේෂයෙන්ම විධායකය අහෝසි කිරීම වෙනුවෙන් ඉතිහාසය පුරා මාරාන්තික සටනක නියැලුන ජනතා විමුක්ති පෙරමුණ මේ මොහොතේ පෙනී සිටින්නේ විධායක ජනාධිපති ධුරය තවදුරටත් රැකගැනීම වෙනුවෙනි. විධායකය අහෝසි කිරීම ආණ්ඩුවේ උප්පරවැට්ටියක්ය, ජනාධිපතිවරයා සිය බලය රැකගැනීමට කර සටකපට වැඩක්ය, කියමින් මේ මොහොතේ ඒ අහෝසි කිරීමට විරුද්ධ ප්‍රතිපත්තියකට මාරුවී ඇත. එසේම සමගි ජන බලවේගයද කියන්නේ දැන් මේක කරන්න ඉඩ දෙන්නේ නැති බවය. ඔවුන්ගේ මතය වන්නේ ද මීළඟ මහ මැතිවරණයෙන් පසුව නව ආණ්ඩුවක් පිහිටුවා විධායකය අහෝසි කිරීම ගැන කතා කළ හැකි බවය. යළි මහ මැතිවරණයක් පැවැත්වීමට නියමිතව ඇත්තේ 2025 වසරේදීය. විධායකය අවශ්‍ය බවට පෙනී සිටි පොදුජන පෙරමුණ වෙතින්ද පසුගියදා කියැවුණේ 2025 මහ මැතිවරණයෙන් පසුව ඒ ගැන කල්පනා කළ හැකි බවය. එනම් මේ වන විට පොදු ජන පෙරමුණද, ජවිපෙද, සජබයද සිටින්නේ එකම මතයකය. එමෙන්ම මෙම පක්ෂ එළඹෙන ජනාධිපතිවරණයට අපේක්ෂකයන් ඉදිරිපත් කිරීමේ අපේක්ෂාවෙන් පසුවේ.

කොහොම නමුත් විධායකය ජනාධිපති ධුරය අහෝසි කිරීම විය යුතු බව දේශපාලන ක්ෂේත්‍රයේ සහ සමාජයේ බුද්ධිමය කතිකාවත් තුළත් හැමදාමත් තිබුණ ඉල්ලීමකි. සටන් පාඨයකි. පසුගිය අරගල සමයේදීද මෙම සර්වබලධාරී විධායක ජනාධිපති ධුරය අහෝසි කළ යුතු බවට ප්‍රබල මතයක් කුළු ගැන්වී තිබිණි. සිස්ටම් චේන්ජ් කළ යුතු වීම ගැන පුළුල් සාකච්ඡාවක් අරගලය තුළ පැන නැගුණු අතර විධායකය අහෝසි කිරීම එම සිස්ටම් චේන්ජ් හි ප්‍රමුඛ අවශ්‍යතාවයක් විය.

එහෙත් දැන් ගැටලුව ඇත්තේ විධායකය අහෝසි කළ යුතු බව කිව් පාර්ශ්වයන්ම දැන් ඊට වෙනස් මතයක් දැරීමය. ඒ වෙනස එන්නේ විධායකය හෝ ඒ හොබවන පුද්ගලයා හෝ නිසා රටට සිදුවන යහපතක් හෝ වෙන යම් අවශ්‍යතාවයක් ඔවුන්ට පෙනී ගොස් ඇති නිසා නොවේ. මේ දේශපාලන තක්කඩිකමය. ඒ තම තමන්ගේ හුදු පාර්ශ්වික දේශපාලනය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් ගෙන තිබෙන තීන්දු නිසා බව පැහැදිලිය. මේ මොහොතේ විධායකය අහෝසි කිරීමේ පියවරකට ජනාධිපතිවරයා කටයුතු කළහොත් ඊට පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක අනුමැතියත්, ජනමත විචාරණයක අනුමැතියත් අවශ්‍යය. ජනාධිපතිවරයා එයට මුල් වීම තුළ එහි ජයග්‍රහණයේ දේශපාලනික වාසිය ඔහුට යෑම වැලැක්වීම විපක්ෂයේ වුවමණාවය. මේ අනුව තමන්ට සිදුවන වාසි අවාසි මත තම ප්‍රතිපත්ති වෙනස් කරන පිළිවෙතක් විපක්ෂය තුළ ඇති බව මේ තත්වයන් මත පැහැදිලි වන සරළම කාරණයයි. කන්න ඕන උනාම කබරගොයත්
තලගොයා කරගන්නවා කියන්නේ මේකටය.

විධායක බලැති ජනාධිපති ධුරය රටේ දේශපාලනයට විසකුරු නම් එය අහෝසි කිරීමට අවස්ථාවත් එළැඹ ඇති නම් ඒ ගැන තවත් දෙගිඩියාවක් විවාදයක් තිබිය යුතු නැත. එය සිදු කළ යුතුය. රටට වගවීමක් ඇති නම් පක්ෂ විපක්ෂ භේදයකින් තොරව ඒ සද්කාර්යයට දායක විය යුතුය. ජරාජීර්ණ වී ඇති සිස්ටම් එක වෙනස් කිරීමට මේ අවස්ථාවෙන් ප්‍රයෝජනය ගත යුතුය. අද තිබෙන අවස්ථාව හෙට නැතිවිය හැකිය. මන්ද දේශපාලනය අවිනිශ්චිතය. තමන් බලයට ආ පසු වැඩේ කෙරෙනවාය කියන පොරොන්දුව තවදුරටත් කිසිවකුත් විශ්වාස කරන්නක් ද නොවේ. ඒ ලණුව මේ රටේ ජනතාව ගිල්ලේ වරක් දෙවරක් ද නොවේ. මේ නිසා තමන්ට වාසි වන පිට්ටනියේදි පමණක් සෙල්ලම් කිරීමට විපක්ෂයේ ඇති වුවමණාව ඔවුන්ගේ හුදු බලලෝභය පෙන්වීමක් පමණක් වන අතර අවසාන වශයෙන් රටේ ජනතාවට අලාභයක්ම ඉතුරු කරන්නක් බවත් කිව යුතුය. අද රට බංකොලොත් තැනට ඇද වැටීමට මේ පාර්ශ්වික දෙබිඩි දේශපාලනය හේතුවක් වූ බවත් සත්‍ය කරුණකි.

කොහොම නමුත් රට අර්බුදයට ගොදුරු වූ මොහොතේ රට භාර ගැනීමට කළ ආයාචනය මේ ජවිපෙ සජබ විසින් ප්‍රතික්ෂේප කරන තැනට උපක්‍රම තේරුවේ රට ගොඩ ගැනීමේ කාර්යය ඔවුන්ට කළ නොහැකි නිසාය. ඒ තිබුණු අවදානම අනුව තමන් අසමත් වන බව දැන ගෙනය. ඒ අවාසි වන බව දැනගෙනය. කොහොමත් එදා තනතුරු ලෝභයෙන් හෝ රට භාර ගත්තා නම් රට අද සොහොන් පිටියක් වනවාටත් සැක නැත. ඔවුන්ගේ දේශපාලනයත් අවසන් වෙනු ඇත. ඒ නිසා ඔවුන්ට වාසිදායක මොහොත එළැඹෙන තුරු කල් මැරීම සිදුවෙමින් තිබේ. එහෙත් රටේ වගකීම භාරගත් රනිල් යන්තම් රට ගොඩදැමීමට අවශ්‍ය පියවර එකින් එක ක්‍රියාත්මක් කරමින් තිබුණත් වගකිව යුතු විපක්ෂ ලෙස එම කාර්යභාරයටවත් සහය නොවී සිටීමේ ප්‍රතිපත්තියකට විපක්ෂය මාරුවුණේ ඒ සාර්ථකත්වය මත ඔවුන්ට සිදුවන දේශපාලනික අවාසිය නිසා බවත් පැහැදිලිය.

මේ අතර රනිල්ගේ නිවැරදි පිළිවෙත්වල සාර්ථකත්වය ඉදිරියේ මේ කණ්ඩායම්වල පැරණි ප්‍රතිපත්ති අංශක 180කින් වෙනස් වීමද නිරීක්ෂණය කළ හැකිය. මූල්‍ය අරමුදලට ගිහින් ගොඩ ගිය රටක් නෑ කියපු අය අද මූල්‍ය අරමුදල සමඟ වැඩකිරීමට සූදානම්ය. මූල්‍ය අරමුදලේ යම් නිර්දේශ ක්‍රියාත්මක්වීම රජය වෙතින් ප්‍රමාදවීම මත එම ණය වාරික නොලැබෙන කොට එම නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම ගැන රජයට චෝදනා කරන තැනටත් මේ අය වෙනස් වී තිබේ. රජය ව්‍යාපාර කිරීමෙන් ඉවත් විය යුතු බව රනිල් කියන කොට මේ අයද එයම කියන්නට ගත්තේය. එය ප්‍රමාද වෙන කොට රජයට චෝදනා කරන්න පටන්ගෙන තිබේ. මේ ආදී වශයෙන් තමන් දැඩිව එල්බගෙන සිටි ප්‍රතිපත්ති අද මාරු කරගන්නා තැනට පත් වන්නේ රජයටවත් ජනතාවටවත් ඇති ආදරයක් නිසා නොවේ. කෙසේ හෝ රජයට එරෙහිවීම විය යුතු නිසාය. එතනදි තමන්ගේ ප්‍රතිපත්ති අදාල නැත. මේ පෙන්වමින් සිටින්නේ තමන්ට අත්පත් කරගත හැකි දේශපානික වාසියක් ඇති නම් එය ඩැහැ ගැනීමේ පෙරේතකම මත ඕනෑම දහදුරා වැඩක් වුව කිරීමේ සූදානමය.

මේ අතර පවතින අවුල් සහගත මැතිවරණ ක්‍රමය වෙනස් කර වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයකට මාරු වීම වෙනුවන් රජය ගන්නා පියවරයන්ටද මෙම විපක්ෂය දැනටමත් විරෝධය පළ කර ඇත. පැරණි ක්‍රමයම තවදුරටත් තිබිය යුතු බව කියමින් සිටී. තමන්ගේ වාසිය වෙනුවෙන් එකම දෙයට විටෙක විරුද්ධ වෙමින් තවත් විටෙක පක්ෂ වෙමින් දේශපාලන පක්ෂ නටන මේ නාඩගම්වලින් මේ රට වැටී තිබෙන ගොහොරුවෙන් ගොඩ එනවා නම් බොරුය. කාලයක් ජනප්‍රිය කතාවක්ව තිබුණේ මේ රට හදන්න නම් පාලකයන් මාරු කිරීමට පෙර ජනතාව මාරුකිරීම විය යුතු බවය. නමුත් අද පාලකයාත් ජනතාවත් නිවැරදි දේ සමග සිටින විට රට හදන්න වගවීමක් ඇති, ප්‍රතිපත්තියක් ඇති විපක්ෂයක් නොමැති වීමේ ගැටළුව මතුව තිබෙන බව පැහැදිලි කරුණකි.

සෝෂක

# ජීවිතවලට ලංසු තියන ගංවතුරේ දේශපාලනය



"නිල්වලා සහ ගිං ගංගාවල ඉහළ ධාරා ප්‍රදේශවලට ලැබුණු වැසි තත්ත්වයත් සමග මාතර සහ ගාල්ල දිස්ත්‍රික්කවල පහත් බිම් වල පවතින ගංවතුර තත්ත්වය යළිත් ඉහළ යා හැකි බව වාරිමාර්ග දෙපාර්තමේන්තුව අනතුරු අඟවයි. එසේම මාතර දිස්ත්‍රික්කයේ අකුරැස්ස, මාලිම්බඩ,
තිහගොඩ, කඹුරුපිටිය සහ මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල සහ ගාල්ල දිස්ත්‍රික්කයේ බොපේ පෝද්දල, නාගොඩ, බද්දේගම ගංගා දෙපස වෙසෙන ජනතාව අවධානයෙන් පසුවන ලෙස ද දන්වා සිටියි."

මේ ඔක්තෝබර් 12 වෙනිදා මාධ්‍ය හරහා ප්‍රචාරය කරන ලද පුවතකි. ඊට පෙර සති කිහිපයක් පුරා ගංවතුර ආපදා තත්වය නිසා අවතැන් වූ ජනතාව පිළිබඳවත්, හානි වූ දේපළ පිළිබඳවත් පුවත් සංසරණය විය. ලංකාවේ ජීවත්වන සියලූ දෙනාට ජීවිත කාලය පුරාම මේවා අහලා දැකලා පුරුදු සාමාන්‍යකරණය වූ ප්‍රවෘත්තින්ය. ස්වාභාවික ආපදාවක් නිසා ජීවිත හානි සිදු වුවද එය එසේමය. විශේෂය වන්නේ දේශපාලනය තුළ ඒවා ලංසු තබන එක පමණය.

### ගංවතුර උවදුරු

ජලය හේතුකොට ගෙන සිදුවන ස්වාභාවික ආපදාවන් ප්‍රධාන වශයෙන් දෙකකි. එකක් උග්‍ර ජල හිඟය නිසා සිදුවන නියඟයයි. අනෙක අධික වැසි තත්වයන් මත නිර්මාණය වන අතිරික්ත ගංවතුර උවඳුරයි. ලෝකය පුරා නියඟය නිසා සිදුවන ආපදා තත්වය වඩාත් හානිදායී විපත් අතර ප්‍රධාන වේ. ඊට දෙවැනි බරපතලම හානි ගෙන දෙන ආපදාව වන්නේ අතිරික්ත ගංවතුර උවදුරය. ලංකාවේ ද එය එසේමය.

අපේ රටේ පිහිටීම අනුව වර්ෂය පුරාම වැසි ඇදවැටෙන රටකි. නිරිතදිග මෝසම, ඊසාන දිග මෝසම, සංවහන සහ වාසුළි යනු වර්ෂය පුරා පැතිරුණු වර්ෂාව ගෙන එන ප්‍රධාන ආකාරයන් වේ. මේ අයුරින් ඇදහැලෙන වර්ෂාවේ ප්‍රබලත්වය මත පහත් බිම් යටකරමින් සිදුවන අධික ජලගැල්ම මෙරට මිනිස් ජීවිත, දේපල පමණක් නොව අනාගත සංවර්ධන ඉලක්කයන් ද සොදාපාළුවට හසුකොට ගනී. එසේ ලංකාවේ සිදුවූ ගංවතුර උවදුරු ඉතිහාසය දෙස විමසා බැලීමේ දී බරපතල ඛේදවාචකයන් ඉතිරි කොට මිනිස් ජීවිත, දේපල ගසාගෙන මහා ගංවතුර ගලාගිය
වර්ෂ ලෙස 1913, 1940, 1947, 1957, 1969, 1978, 1989, 1992, 2003 හඳුනාගත හැකිය. එසේම මෑත කාලයේ 2017 වර්ෂය ද මිනිස් ජීවිත සිය ගණනක් අහිමි කළ දරුණු ගංවතුර උවදුරක් සිදුවූ වර්ෂයකි.

මේ දිනවල ප්‍රධාන වශයෙන් නිල්වලා, ගිං, කළු සහ වළවේ ගංගාවල අධික ජල ගැල්ම හේතුකොට ගෙන නැවතත් ගංවතුර පිළිබඳ පුවත් මැවෙමින් කතිකා ගොඩනැගෙමින් පවතී. ගාල්ල සහ මාතර ප්‍රදේශවලට සිදුවූ ගංවතුර උවඳුර සම්බන්ධයෙන් සැලකුවහොත් එය බොහෝ සෙයින් මිනිස් ක්‍රියාකාරීත්වයේ ප්‍රතිඵලයන් මත ගොඩනැගුනක් බව පැහැදිලිය. මන්ද නිල්වලා ගිං ගංගාවලින් සිදුවන ගංවතුර උවදුරු අවම කරගැනීම සම්බන්ධයෙන් යෝජනා කරන ලද එකදු ව්‍යාපෘතියක් හෝ නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට විවිධ පාර්ශවයන් විවිධ හේතු දක්වමින් ඊට විරෝධය දැක්වීම හෝ කඩාකප්පල් කිරීම හේතුවෙනි. විටෙක පරිසර සංවිධාන ද තවත් විටෙක දේශපාලන පක්ෂ හෝ කණ්ඩායම්වල විරෝධයන් ද තවත් විටෙක මහජන කැළඹීම් හෝ පෙළඹවීම් මත ගොඩනැගුණු විරෝධයන් ද හේතුවෙන් අදටත් අධික වැසි කාලවල නිල්වලා සහ ගිං ගංගා පහත් බිම් ප්‍රදේශ යටකරමින්, දේපල හානි සිදුකරමින් ඇතැම් විට මිනිස් ජීවිත උදුරා ගනිමින් සුපුරුදු පරිදි ගලා යමින් තිබේ. එසේ වසර ගණනාවක් පුරා විරෝධයට හසු වූ එක් ව්‍යාපෘතියක් නම් නිල්වලා ගංගා ජලයෙන් කොටසක් අලූත් මගක් ඔස්සේ අධික වියලි කාළගුණයක් සහිත හම්බන්තොට ප්‍රදේශයට හැරවීමේ වැඩපිළිවෙළය.

### ගිං නිල්වලා ජල හැරවුම

නිල්වලා ගඟේ සහ ගිං ගඟේ ජලය හම්බන්තොටට හරවා යැවීමේ යෝජනාව අද ඊයෙක සිදුවූවක් නෙවේ. එය පළමුව සිදුකර ඇත්තේ 1887 වර්ෂයේ බ්‍රිතාන්‍ය පාලන සමයේ දීය. ඉන්පසුව මේ යෝජනාව පිළිබඳ අවස්ථා ගණනාවක විවිධ කතිකා නිර්මාණය වී ඇති නමුත් මනා වැඩපිළිවෙලක් සැලසුමක් සහිතව 1936 දී එවකට මොරවක ආසනයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා වූ වෛද්‍ය එස්.ඒ. වික්‍රමසිංහ විසින් ගෙන ආ යෝජනාව සැලකිය හැකිය. එමගින් යෝජනා කෙරුණේ නිල්වලා ගඟේ ඉහළ ප්‍රදේශයේ ජලාශයක් ඉදිකර එම ජලය හම්බන්තොට දිස්ත්‍රික්කයට හරවා යවා ඒ හරහා එම ප්‍රදේශයේ බහුකාර්ය සංවර්ධනයට කටයුතු කළ යුතු බවය. එය ද යෝජනාවක් පමණක්ම විය. මේ සම්බන්ධයෙන් 1968 වසරේ දී වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ඇමෙරිකන් සමාගමක් හා එක් ව කළු, නිල්වලා හා ගිං ගංගා ද්‍රෝණිවල ජලය වියළි කලාපයට හරවා යැවීම සඳහා වූ ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර ඇත. එසේම 1980 වසරේ දී නිල්වලා ගඟේ ගංවතුර පාලනය කිරීම සඳහා ප්‍රංශ ආධාර යටතේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක විය.

එසේම 2011 - 2012 කාලයේ ගාල්ල මාතර ප්‍රදේශවල ජනතාවට බලපාන ගංවතුර උපද්‍රවය අවම කිරීමත් වියළි කාලගුණයෙන් බැටකන හම්බන්තොට මොනරාගල දිස්ත්‍රික්කවල පානීය ජල ගැටලුවට විසඳුම් ලබාදීමත් අරමුණු කොට ගනිමින් ඇමරිකානු ඩොලර් 690ක වියදමින් ගිං සහ නිල්වලා ගංගා ජලය හම්බන්තොට ප්‍රදේශයට හරවා යැවීමේ ව්‍යාපෘතිය පිළිබඳ කතිකාව නැවතත් චීන සමාගමක් හා එක්ව ක්‍රියාත්මක විය. මෙම ව්‍යාපෘතිය තුළ යෝජනා වූයේ, ගිං ගඟ පිටදෙණියාව ප්‍රදේශයෙන් හරවා සිංහරාජය හරහා උමං මාර්ගයෙන් කොටපොළ ප්‍රදේශයට ගෙන ඒමටත් එතැන් සිට නිල්වලා ගඟේ ජලය ද එකතු කොට ගෙන අම්පානගල ජල හැරවුම් ඒකකයෙන් වීරකැටිය මුරුතවෙල ජලාශයටත් එතැන් සිට ඇඹිලිපිටිය චන්ද්‍රිකා වැවටත් ජලය ගෙන යාම ගිං නිල්වලා ගංගාවල ජලය හම්බන්තොටට හැරවුමේ මාර්ග සිතියම බවය. කෙසේ වෙතත් මෙම ව්‍යාපෘතිය ද විවිධ දේශපාලන කතිකාවන් බොහොමයක් මැද අල්ලස් ගනුදෙනුවක සිර වී අදටත් යෝජනාවක් පමණක්ම වී තිබේ.

කෙසේ වෙතත් 2019 වර්ෂයේ දී මාතර දිස්ත්‍රික්කයට බලපෑ ගංවතුර තත්වය පාලනය කිරීම සඳහා නිල්වලා ගඟේ ජලය මුහුදට වැටෙන මාතර මෝය කට කපා පුළුල් කිරීමක් නම් මාතර දිස්ත්‍රික් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මැදිහත් වීමෙන් සිදුවිය.

### ආපදා කළමනාකරණය

ගංවතුර කළමනාකරණය යනු මෙරට සිදුවන බහුවිධ ස්වාභාවික ආපදා කළමනාකරණයන් අතර එක් ප්‍රවේශයක් පමණි. ඒ සෑම වසරකම ඇතිවන ගංවතුර, නායයෑම්, අකුණු, සුළි කුණාටු, නියඟ හා වසංගත යනාදි ස්වාභාවික ව්‍යසනවලින් ශ්‍රී ලංකාවට දැඩි බලපෑමක් සිදුවන බැවිනි. සමකයට ආසන්න නිවර්තන කලාපීය අනෙකුත් රටවල් ද මෙවැනි ස්වභාවික ව්‍යසනවලට ගොදුරු වන නමුත් අපේ රටේ පිහිටීම ස්ථාවර භූ තැටියක වන බැවින් ගිනිකඳු, භූමිකම්පා වැනි භූ විද්‍යාත්මක ව්‍යසනවලින් ස්වාභාවිකවම සුරක්ෂිතය. එමනිසා ගංවතුර කළමනාකරණය යනු නියගය, සුළි කුණාටු හැරුණු කොට අපේ රටේ අධික වර්ෂාව හේතුවෙන් වන අතිරික්ත ගංවතුර, නායයෑම්, පහත් බිම් යටවීම්, දේපල හානි වැනි ස්වභාවික ව්‍යසන අවම කරගැනීම සම්බන්ධයෙන් වූ මූලික ප්‍රවේශයකි.

අහසින් ඇද වැටෙන එක් දිය බිඳක්වත් භාවිතයට නොගෙන මුහුදට ගලාගෙන යාමට ඉඩ නොදිය යුතු යැයි ලිඛිත ඉතිහාසයේ ඇති පැරකුම්බා ප්‍රකාශයේ පටන් ජල කළමනාකරණය කෙරේ වසර සිය ගණනක් පුරා මෙරට පාලකයන්, විද්වතුන් සහ තවත් විවිධ කණ්ඩායම් ඔවුනොවුන්ගේ දැනුම් මට්ටම් අනුව වගේම ඒ ඒ කාලවලට අදාළව නොයෙක් විසඳුම් යෝජනා සිදුකොට ක්‍රියාත්මක කර තිබේ. මෑත කාලයේ ද ක්‍රියාත්මක කළ එකී බොහෝ ප්‍රවේශයන්ගේ බරතැබීම සිදුකොට ඇත්තේ, ආපදාවක් සිදුවූ පසු තත්වයන් කළමනාකරණය, හානිය අවම කරගැනීම සහ ප්‍රතිනිර්මාණය කිරීම කෙරේය. එම නිසාම දිගුකාලීන තිරසර ගංවතුර කළමනාකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක වීම විවිධ බලපෑම් සහගත හේතු මත (පරිසර සංවිධාන, දේශපාලනික විරෝධයන් සහ අල්ලස් ගැනීම් වැනි) අක්‍රීයව පැවතිය ද ගං මෝය පුළුල් කිරීම වැනි ක්ෂණික විසඳුම් ක්‍රියාත්මක වීම් එමටය.

කෙසේ නමුත් ලංකාවට අදාළව ගතහොත් ස්වභාවික ව්‍යසන සිදුවන ස්ථාන, වර්ෂයේ මොන මොන කාලවල ද සහ ව්‍යසන නිර්මාණය වන විධි යන කරුණු බොහෝ විටම නිශ්චිතය. එසේම අදවන විට අදාළ විෂය පිළිබඳ තාක්ෂණික වගේම දැනුම්වත්භාවය පුළුල්ය. එමනිසා මේ සියලු සාධක උපයෝගී කොටගෙන විය යුත්තේ උවදුරු ඇතිවීමේ ප්‍රවේශයන් වැළැක්වීමට පියවර ගැනීමය.

### විරෝධතාකරුවන්ගේ ප්‍රවේශය

නිල්වලා ව්‍යාපෘතිය වගේම ගංවතුර උවදුරු අවම කරගැනීමේ පළල් ව්‍යාපෘති කෙරේ විවිධ හේතු දක්වමින් විරෝධය දක්වන බොහෝ දේශපාලන කණ්ඩායම්, සංවිධාන අධික ගංවතුර නිසා විපතට පත්වන්නන්ගේ අයිතිය වෙනුවෙන් උවදුරෙන් පසු පෙනී සිටිනු දැකගත හැකිය. නමුත් සාමාන්‍ය ජනතාව විපතට ගොදුරුවන උපද්‍රව අවම කරගැනීම හෝ නැතිකිරීම වෙනුවෙන් ගෙන එන දිගුකලීන හෝ තිරසර ඕනෑම ක්‍රියාමාර්ගයක්, සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මකවීම වැළැක්වීමට එකී දේශපාලන හා සමාජ කණ්ඩායම්වල පිරිස් විසින් තමන් ගතහැකි සෑම පියවරක්ම ක්‍රියාත්මක කරනු ඉතිහාසය පුරා දැක ඇත. එය ද ජනතාව වෙනුවෙන් යැයි ඔවුන්ගේ අදහසය. මෙකී විරෝධයන් නිසා නැවත නැවතත් පීඩාවට පත්වන්නේ ද සාමාන්‍ය ජනතාවමය. පීඩාවට පත් වූවන් වෙනුවෙන් මුට්ට කරගැසීම, ආහාර පාන ලබාදීම, කුණු කසල ඉවත් කිරීම ආදී දේශපාලනික වාසි සහගත ලාභදායී කටයුතු කෙරේ වැඩි ඇල්මකින් මෙකී දේශපාලන සමාජ කණ්ඩායම් මැදිහත් වන අයුරුද දැකගත හැකිය. විශේෂයෙන් විරුද්ධ පාක්ෂික දේශපාලන බල වුවමනාව හෝ සිය වෘත්තීයභාවය රැකගැනීම වෙනුවෙන් මේ දෙබිඩිකම මනාසේ නඩත්තු කරමින් සිටියි.

එම නිසාම ගංවතුර උවදුරු ඇතිවීමට හෝ ඇතිවීමේ මාර්ගයන් වැළැක්වීමට ගෙන එන ව්‍යාපෘති කඩාකප්පල් කරනවා පමණක් නොව ඒ වෙනුවෙන් වූ කිසිදු සාධනීය යෝජනාවක් සිදු නොකරන අතර කිසියම් ආකාරයකින් ජනතාව විපතට පත් වූ පසු කටයුතු කෙරේ විවිධ පාට පාට බලකායන් ගොඩ නගාගෙන, යහමින් දෙස් විදෙස් ආධාර ලබාගෙන සිය දේශපාලන වෘත්තීයභාවය නඩත්තු කරන අයුරු ඔවුන්ගේ දේශපාලන භාවිතාව පිළිබඳ විමසීමකින් බලන්නෙකුට පැහැදිලිව හඳුනා ගත හැකිය. යැපුම් මානසිකත්වය වැනි මෙරට සමාජ සංස්කෘතික ස්වභාවයන් ද මෙකී දේශපාලන කණ්ඩායම්වලට මනා පිටුවහලක්ව පවතී. එමනිසා මේ රටේ ගංවතුර උවදුරු හෙට දවසේ ද අලුත් වෙවී ප්‍රවෘත්ති ලෙස අසන්නට ලැබෙනු ඇත. එය එසේ නොවන්නට නම් මනා දැක්මකින් යුතු දිගු වැඩපිළිවෙලක්, පුළුල් ජාතික සැලසුමක්, සමාජ කතිකාවක් ද සහිතව නොවැලැක්විය හැකි දේශපාලන මැදිහත්වීමක් සහිතව ක්‍රියාත්මක විය යුතුය.

නවන් පතිරත්න

## Mr. President

ජාත්‍යන්තර සමුළු කිහිපයකට සහභාගී වෙමින් ජනපති මෙම සතිය ගෙවා දැමූවේ රාජ්‍ය තාන්ත්‍රික පිළිගැනීමට ලංකාවට ලබා දෙමිනි. ජාත්‍යන්තරය ඉදිරියේ පසෙකට තල්ලුවී තිබූ ශ්‍රී ලංකාව ජනපති රනිල්ගේ මැදිහත්වීම තුළ ඉදිරියට එමින් තිබේ. **"ඉන්දියානු සාගර වටද්දර සමුළුව"** ජනපති රනිල්ගේ ප්‍රධානත්වයෙන් පැවැති අතර රාජ්‍යයන් 28ක විදේශ අමාත්‍යවරුන් ඊට සහභාගී වී සිටියහ.

ජනපති සති අන්තයේ මඩකලපුවේ සංචාරය කළේ රටවල් ගණනාවක පරිසර අමාත්‍යවරුන් මෙරටදී පැවැත්වූ සමුළුවට සහභාගී වීමෙන් පසුවය. **"ගාලු කතිකාව සාගර සමුළුව"** පැවැතුණේ බ්‍රහස්පතින්දාය. වසරකට පෙර පෝලිම් යුගයකට තල්ලු වෙමින් ජාත්‍යන්තරය හමුවේ පැත්තකට තල්ලු වූ රට, ජනපති රනිල්ගේ වැඩපිළිවෙල හමුවේ ජාත්‍යන්තරය ඉදිරියට පැමිණෙමින් සිටී.

මෙලෙස ජාත්‍යන්තරය දිනා ගන්නා අතර ජනපති රනිල් මඩකලපුවේදී සිය ගෝල බාලයන්ට හොඳ උපදෙස් දුන්නේය. ඒ තමන්ගේ උත්සව හා ක්‍රියාකාරකම්වලදී සිය රූපය යොදා බැනර්, කටවුට් පෝස්ටර් භාවිත නොකරන ලෙස කියමිනි.

### ඊශ්‍රායල් - පලස්තීන ගැටුම

සඳුදා කාර්යාලයට පැමිණි ජනපති රනිල් සිය සගයන් සමඟ සාකච්ඡා කළේ ඒ වන විට ලෝකය තුළ අවධානය යොමු වෙමින් තිබූ ඊශ්‍රායල් - පලස්තීන ගැටුම ගැනය. ලෝක බලවතුන් හමුවේ සිදුවන ඕනෑම දෙයක් ලංකාව වැනි රටවලට බලපාන්නේ නිතැතිනි. ඊශ්‍රායල පලස්තීන ගැටුම ගැන මුලින්ම අවධානය යොමු කළේ රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් දිනිත් චින්තක කරුණාරත්නය.

"මේ ගැටුම කොච්චර දුරට යයිද කියලා තවම කියන්න බෑ. නමුත් මේක ලෝකයේ ඉන්ධන හා ගෑස් මිල ඉහළ යාමට බලපානවා." ජනපති රනිල් කීවේ නළල රැළි ගන්වමිනි.

"ඔව් දැනටමත් ලෝක වෙළෙඳපොළේ ඉන්ධන මිල ඉහළ ගිහිල්ලා. පහුගිය සති දෙක තුළ යම් පහළ යාමක් ඉන්ධන මිලේ තිබුණත් දැන් එය ඉහළ ගොස් තිබෙනවා." මන්ත්‍රී වජිර අබේවර්ධන පෙන්වා දුන්නේ එවැන්නකි.

"ඉන්ධන මිල වැඩි වුනාම වකුව බඩු මිලත් ඉහළ යනවා. මේක අපේ ජනතාවට දැනෙන ප්‍රශ්නයක්." කාර්ය මණ්ඩල ප්‍රධානි සාගල කීවේ බැරෑරුම්වය.

"ජනාධිපතිතුමා මේ ගැන ජනතාවට කියන්න. මොකද අපිට පාලනය කරන්න පුළුවන් දේවල් වගේම බැරි දේවලුත් තියෙනවා කියලා ජනතාව දැන ගන්න ඕනෑනේ." ලේකම් සමන් ඒකනායක කී දේ කවුරුත් අනුමත කළේය.

ජනපති රනිල් ඊට පිළිතුරු දෙමින් කීවේ තමන් මේ ගැන ඇමති මණ්ඩලයේදී විශේෂ ප්‍රකාශයක් කරන බවය. එය මාධ්‍යට ලබා දෙන ලෙස කී ජනපති එදින පෙරවරුවේ පැවැති ඇමති මණ්ඩලයට ඊශ්‍රායල පලස්තීන යුද්ධය සම්බන්ධයෙන් ලංකාව දරන ස්ථාවරය මෙන්ම එයින් ලංකාවට ඇතිවන බලපෑම ගැනද කරුණු පැහැදිලි කළේය.

ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ මහනුවර ශාඛාව විවෘත කිරීම සඳහා ජනපති සවස මහනුවර බලා ගියේය. විවෘත කිරීමෙන් පසු මහල් හතකින් සමන්විත මෙම විශ්වවිද්‍යාල පරිශ්‍රයේ නිරීක්ෂණ චාරිකාවකට ද ජනපති එක්වූවේය. එහි සිසු සිසුවියන් හා සුහද පිළිසඳරක යෙදීමට ද ජනපති අමතක නොකළේය. කාර්ය මණ්ඩල ප්‍රධානී සාගල රත්නායක ද මෙම අස්ථාවට එක්ව සිටියේය.

### පාලම් ප්‍රශ්නය

බම්බලපිටිය දුම්රිය මගී පාලම ගැන ජනපති කතා කළේ අඟහරුවාදා පැවැති මහා මාර්ග අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ හමුවකදී ය. මාධ්‍ය වාර්තා උපුටා දක්වමින් ජනපති රනිල් නියෝග කළේ වහාම එම ගුවන් පාලම ප්‍රතිසංස්කරණය කරනා ලෙසටය.

ජනපති රනිල් එහිදි නිලධාරීන්ගෙන්

# යුද්ධය නිසා ඉන්ධන මිල ඉහළ යෑමේ අනතුරක්



මධ්‍යම අධිවේගී මාර්ගය ගැන මෙන්ම කටුනායක වරාය නගර අධිවේගි මාර්ගය ගැන ද විමසා සිටියේය. එහි පිටවීම් හා පිවිසුම් දොරටු දෙකක් ඉදිකිරීමට මුදල් නොමැති බවට නිලධාරීන් ජනපතිට පෙන්වා දීමෙන් පසු. එම ගැටළුව විසඳීමේ කාර්ය ජනපති පැවරුවේ කාර්ය මණ්ඩල ප්‍රධානී සාගල රත්නායකට ය. ඊට අමතරව අතරමඟ නතරව පවතින ගුවන් පාලම් තුනක් ඉදි කිරීමේ කටයුතු ගැන ද මෙහිදි සාකච්ඡා වූවේය. එම ගැටළුව විසඳීමට ද ජනපති රනිල් විසින් සාගල රත්නායකට පැවරූ අතර ඒ අනුව ඔහු නිලධාරීන් කැඳවා අවශ්‍ය උපදෙස් ලබා දුන්නේය.

දෙස් විදෙස් වියතුන්ගේ සහභාගීත්වයෙන් **"කොළඹ ගුවන් කතිකාව 2023"** ආරම්භ වූවේ ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී සාගල රත්නායකගේ ප්‍රධානත්වයෙනි. ඇමරිකාව, එංගලන්තය, කැනඩාව, මැලේෂියාව, ඉන්දියාව හා චීනය වැනි රටවල විද්වතුන් රැසක් මේ අවස්ථාවට එක්ව සිටියහ. ජනපති උපදෙස් මත සාගල මෙම අවස්ථාවට එක්වූවේය.

රත්නපුර සීවලි මධ්‍ය විද්‍යාලයේ ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ මංගල සැසිවාරය ජනපති රනිල් වික්‍රමසිංහගේ ප්‍රධානත්වයෙන් ජනාධිපති ලේකම් කාර්යාල ශ්‍රවනාගාරයේදී පැවැත්විනි. ඒ සීවලි විද්‍යාල සිසුන් මීට පෙර ජනාධිපති ලේකම් කාර්යාලය නැරඹීමට පැමිණි අවස්ථාවේ ජනපතිගෙන් කළ ඉල්ලීමකට අනුවය.

### කථානායකට කේක්

එම උත්සවයට කථානායක මහින්ද යාපා අබේවර්ධන ඇතුළු පාර්ලිමේන්තු නිලධාරීන් පැමිණෙන බව දැන සිටි ජනාධිපති ලේකම් සමන් ඒකනායකට තවත් ආරංචියක් දැන ගැනීමට ලැබුණේ එදින පෙරවරුවේය. ඒ කථානායක මහින්ද යාපා අබේවර්ධනගේ උපන්දිනයත් එදිනට යෙදී ඇති බවටය. ජනපති ලේකම් සමන් ඒකනායක වහාම ඇමතුමක් ගත්තේ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහලේකම් චමින්ද කුලරත්නටය.

නියෝජ්‍ය මහලේකම් ඇමතූ ජනපති ලේකම් විමසා සිටියේ "අද කථානායකතුමාගේ උපන් දිනය නේද?" යනුවෙනි. එය තහවුරු කරගත් ලේකම්වරයා වහාම කේක් ගෙඩියක් ගෙන්වා ගෙන උත්සවයට පැමිණි කථානායකවරයාව හදිසි පණිවුඩයක් ඇතැයි කියමින් උත්සව සභාවට යාමට පෙර ජනපති නිල කාමරය වෙත කැඳවාගෙන ගියේය.

ජනපති රනිල්ගේ කාමරයේ කේක් ගෙඩියක් තිබෙනු දුටු කථානායක මහින්ද යාපා ද පුදුමයට පත් වූ අතර කථානායකවරයා කේක් කපා ජනපතිට ද පිළිගැන්වූවේ පැමිණ සිටියවුන්ගේ සුබ පැතුම් මධ්‍යයේය.

ඉන්පසු ඔවුන් සීවලි විද්‍යාලයේ සිසුන් සමඟ එක්වී මංගල සැසිවාරය පැවැත්වූ අතර ජනපති සිසුන්ට උපදෙස් දුන්නේ ශිෂ්‍ය අවශ්‍යතා පිළිබඳව යෝජනා තම අභිමතය පරිදි කෙටුම්පත් කොට ශිෂ්‍ය පාර්ලිමේන්තුව වෙත යොමු කරන ලෙසය.

ජාතික ලොතරැයි මණ්ඩලයේ 60 වන සංවත්සරය වෙනුවෙන් නිකුත් කළ ලොතරැයියේ පළමු පිටපත ජනපතිට භාර දුන්නේ ද එදින සවසය.

ඉන්දියානු සාගල කලාපීය වටද්දර සමුළුවට සහාභාගීවීම සඳහා මෙරටට පැමිණ සිටින දකුණු අප්‍රිකානු විදේශ ඇමතිවරිය මෙන්ම එක්සත් රාජධානියේ ඉන්දු පැසිපික් කලාපීය රාජ්‍ය අමාත්‍යවරිය ඇතුළු විදෙස් ඇමතිවරු රැසක් ජනපති මුණ ගැසී කතා බහ කළෝය.

මාතර හා ගාල්ල දිස්ත්‍රික්කවල ගංවතුරෙන් පීඩාවට පත් ජනතාවට උපකාර කිරීමට හා විනාශ වූ මාර්ග ප්‍රතිසංස්කරණය වෙනුවෙන් කටයුතු කරන ලෙස ජනපති උපදෙස් දුන්නේ ලේකම් සමන් ඒකනායකටය. ජාතික තොරතුරු තාක්ෂණ හා ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ ප්‍රදර්ශනයට සහභාගීවීම සඳහා ජනපති කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව වෙත ගියේ බදාදා ය.

කලා භූෂණ රාජ්‍ය සම්මාන උත්සවය ද පැවැතියේ එදිනමය. දිවයින පුරා සිටින කලාකරුවන් 200ක පමණ පිරිසකට සම්මාන පිරිනැමුවේ මහරගම තරුණ සේවා සභාවේදී ජනපතිගේ සුරතිනි.

ඉන්දියානු සාගර කලාපීය වටද්දර සමුළුවට සහභාගීවීමට මෙරටට පැමිණ සිටින ඉන්දීය විදේශ ඇමති ආචාර්ය එස්. ජයශංකර් මුණ ගැසුණේ ජනපති කාර්යාලයේදීය.

දෙරට අතර සබඳතා ගැන මෙන්ම දෙරට අතර සහයෝගීතාව වර්ධනය වන ගිවිසුම් තුනකට ද මෙහිදි අත්සන් තැබීය. ජනපති රනිල් මුණ ගැසීමට මැති ඇමතිවරු පිරිසක් පැමිණියේ බ්‍රහස්පතින්දා දහවල් කාලයේය.

ගාලු කතිකාවක සාගර ආරක්ෂක සමුළුවට එක්වීමට එදින පෙරවරුවේ ගාල්ලට ගිය ජනපති ඉන්දියාව හා ලංකාව ඇතුළු ආසියානු කලාපයේ ශිෂ්ඨාචාරය ආරක්ෂා කර ගැනීම ගැන මෙන්ම ඊශ්‍රායල් පලස්තීන යුද්ධය ගැන ද අදහස් පළ කළේය. මෙම යුද්ධයේ ආනාගතය කෙබඳු වේදැයි කිව නොහැකි බවද ඔහු කියා සිටියේය.

### හරීන්, මනූෂ බොරුවට බය වෙලා

සමුළුව නිමවා සිය කාර්යාලය වෙත පැමිණි ජනපති හරීන්, මනූෂ ඇතුළු මැති ඇමතිවරු පිරිස මුණ ගැසුණේ ගමන් විඩාව පසෙක තබාය. "අපි ඇමතිකම්, මන්ත්‍රීකම් දරණ අවසන් දවස් කියලා තමයි කට්ටිය කියන්නේ" ඇමති හරීන් කීවේ සිනා මුසුවය.

"බොරුවටනේ ඔයාලා බය වෙලා ඉන්නේ. මුලින්ම නසීර් අහමඩ්ගේ මන්ත්‍රී ධූරය ගැන දීපු නඩු තීන්දුව හොඳින් කියවන්න." ජනපති කීවේ මන්ත්‍රී දෙපළ දෙස බලමිනි.

"නසීර් අහමඩ් එයාට පක්ෂයෙන් එවපු චෝදනා පත්‍රයට උත්තර බැඳලා නෑ. ඒකට උත්තර දෙන්න කල් අරගෙන තියෙනවා විතරයි. තමන්ට විරුද්ධව දීපු චෝදනා පත්‍රය වැරදියි කියලා එයා පිළිතුරු දෙන්න ඕනා. ඒක කළේ නැති නිසා තමයි උසාවිය මේ තීන්දුව දුන්නේ." මන්ත්‍රී වජිර ද කතාවට එකතු වූවේ එලෙසිනි.

### චීනෙයි අපෙයි වැඩ

"චීන ණය සහනය ගැන අයි.එම්.එෆ්. කට්ටිය දන්නේ නෑ කියන්නේ." ඒ පැනය මහාචාර්ය ආශු මාරසිංහගෙනි.

"ඔව් ඒක එයාලට කියන්නේ නෑනේ. චීනය සමඟ අපි කතා කළා. එයාලා අපිට සහනයක් දෙන්න එකඟවෙලා තියෙනවා. සාකච්ඡා ඉවර වුනාට පස්සේ ගිවිසුම් අත්සන් කළා." සාගල රත්නායක කීවේ එවැන්නකි.

"අයි.එම්.එෆ්. දෙවෙනි වාරිකය දෙන්නේ නෑ කියලා විපක්ෂය කියනවා." ඒ පැනය ඇමති ප්‍රසන්න රණතුංගගෙනි.

"අපිට ජනතාවට බර පටවන්න බෑ. නමුත් ආදායම් වැඩි කරගැනීමේ යෝජනා අපි දීලා තියෙනවා. ඒවා එයාලාට ප්‍රතික්ෂේප කරන්න බෑ .ඒ නිසා එයාලට දෙවෙනි වාරිකය නිදහස් කරන්න වෙනවා." ඇමති සියඹලාපිටිය ද කතාවට එකතු වූවේය.

නසීර් අහමඩ්ගෙන් හිස්වූ පරිසර ඇමති ධූරය ව්‍යවස්ථානුකූලව ජනපති යටතට පත්ව තිබෙන බව මෙහිදි හෙළිදරව් විනි. ජනපති චීන සංචාරයෙන් පසු නව ඇමතිවරයෙකු මේ විෂයට පත් කරන්නේ ද නැතිද යන්න ගැන තීන්දුවක් ගැනීමට නියමිතය.

ලෝක බලවතුන්ගේ යුද්ධය හේතුවෙන් ඉන්ධන ඇතුළු භාණ්ඩ මිල ඉහළ යාම ගැන ද මෙහිදි දීර්ඝ ලෙස සාකච්ඡා කෙරිනි.

### එජාපයේ උණුසුම

එදින සවස ජනපති පක්ෂ මධ්‍යම කමිටුව කැදවා තිබුණේ පක්ෂයේ නිලතල කිහිපයක් වෙනස් කිරීමට අදාළව කතා කිරීමටය. පක්ෂයේ හිටපු උපනායක රවී කරුණානායකට ලේකම් ධූරය හෝ නියෝජ්‍ය නායක ධූරය පිරිනැමිය යුතු බවට ඉදිරිපත් වූ යෝජනාවක් ගැන ජනපති මධ්‍යම කමිටුව දැනුම්වත් කළේය.

ඒ වන විටත් කළමනාකරණ කමිටු රැස්වීමට පැමිණි පිරිස් ජනාධිපති කාර්යාලයේ පහළ මහලයේ රැදි සිට ඇති අතර ඔවුන් පැමිණෙන මධ්‍යම කමිටු සාමාජිකයන්ට දැනුම් දී ඇත්තේ "අන්න මහලේකම් තනතුර හා නියෝජ්‍ය නායක තනතුරු වෙනස් කරන්න හදනවා ඉක්මනට උඩ ජනාධිපතිතුමාගේ කාර්යාලයට යන්න" කියාය.

එම උණුසුම ජනාධිපති කාර්යාලය පුරාම ළැව් ගින්නක් සේ පැතිර ගිය නමුත් කිසිදු වෙනස් කමකින් තොරව කමිටුව අවසන් වූවේය. අනතුරුව පිරිස කළමනාකරණ කමිටුවට පැමිණි අතර එහිදි පක්ෂ සම්මේලනය ගැන මහලේකම් රංගේ ජනපති දැනුම්වත් කළේය. සම්මේලනයේ පෝස්ටරයේ හා බැනරයේ සිට සියළු සැලසුම් ගැන ජනපති දැනුම්වත් කෙරුවේ රංගේ ය.

ජනපති රනිල් එදින විදේශ අමාත්‍යාංශ නිලධාරීන් කැදවා ඊශ්‍රායලේ සිටින ශ්‍රී ලාංකිකයන්ගේ ආරක්ෂාව තහවුරු කරන ලෙස උපදෙස් දුන්නේය.

ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී සාගල රත්නායක ඉකුත් ඉරිදා යුද හමුදාව සමඟ එක්ව දුප්පත් පවුල් 1000කට සහල් මෙට්‍රික් ටොන් 10,000ක් බෙදා දුන්නේ එක පවුලකට හාල් කිලෝ 10ක් ලබාදීමේ ජනපති උපදේශය මතය.

පසුදින වාලුකාරාම පෙරහැර මංගල්‍යයට එක්වූ අතර එදින පෙරවරුවේ නෙදර්ලන්ත තානාපති ඇතුළු මෙරට රජයේ නිලධාරීන් මුන ගැසුනේ ලන්දේසින් මෙරට ආක්‍රමණය කළ අවදියේ මෙරටින් රැගෙන ගිය භාණ්ඩ නැවත ලබාගැනීම ගැන සාකච්ඡාවකටය.

Mediaman



# සමූහ මීනී වළක අපේක්ෂාව පමණක් ඉතිරිකර ඇත

මෑද පෙර දිග කලාපයේ යුද ගිනි මෙන්ම මළ කඳන් ගොඩ ගැසීම අලුත් දෙයක් නොවේ. ඊශ්‍රායල් පලස්තීන දරුණු යුදගැටුම් ද ඒ අනුව වන තවත් අවස්ථාවක් පමණි. වර්තමාන ගැටුමේ ප්‍රභවයට වසර සියයකට ආසන්න ඉතිහාසයක්ද වෙයි. ඒ කෙසේ වුවත් පසුගිය සතියේදී හිටි හැටියේ ඇවිළුණ යුද තත්වය ඉතිහාසයට තවත් මහා මානව ඛේදවාචකයක් නිර්මාණය කරමින් තිබේ. මිනිස්කමට නිගා දෙන භාවිතයක් වූවද යුද්ධයේදීත් අනුගමනය කළ යුතු පිළිගත් නීති රීති තිබේ. ආචාර ධර්ම තිබේ. නමුත් ඒවා මඟහැරී නැතිනම් හිතාමතාම උල්ලංඝණය කරමින් මේ වන විට දෙපාර්ශ්වයම තම තමන්ගේ ම්ලේච්ඡත්වයේ තරම ලෝකයට පෙන්වමින් තිබේ. මෙය යුද්ධයකට වඩා යුධ අපරාධ සමූහයක් ලෙස හැඳින්වීම වඩා නිවැරදිය.

කොහොම නමුත් ඊශ්‍රාලය සහ පලස්තීනය අතර යුද්ධයක් ලෙස මෙය ජාත්‍යන්තර මාධ්‍යයේ මෙන්ම මෙරට මාධ්‍යයන් විසින් හැඳින්වුවත් වඩා නිවැරදි වන්නේ ඊශ්‍රාලය සහ හමාස් සංවිධානය අතර යුද්ධයක් වීමය. අසූව දශකයේ බිහිවූ හමාස් සංවිධානය පලස්තීනයේ විමුක්තිය වෙනුවෙන් දේශපාලනිකව පෙනී සිටින සංවිධානයකි. ඔවුන්ගේ මිලිටරි ක්‍රියාකාරිත්වය ත්‍රස්තවාදීවීම නිසා පලස්තීනයේ විමුක්තිය වෙනුවෙන් පෙනී සිටීමේ වුවමණාව සහිත අනෙක් පාර්ශ්වයන් අධෛර්මත් කරවන්නක් නමුත් එලෙස නොවෙන්නත් හේතු තිබේ. මන්ද වත්මන් යුද්ධයේ කේන්ද්‍ර භූමිය වන ගාසා තීරය වෙතින් ඊශ්‍රායලයට එල්ල වන ප්‍රහාරය ත්‍රස්තවාදී නොවී වෙනකක් වීමට ඉඩක් ඉතිරිකර තිබුණේ නැති නිසාය.

පලස්තීන්ය ලෙස හඳුන්වන්නේ ඊශ්‍රායලයේ නිරිතදිගට වන්න තිබෙන කුඩා ගාසා තීරයත් නැගෙනහිරට වන්නට තිබෙන වෙස්ට් බැංක් භූමි ප්‍රදේශයත්ය. පලස්තීන පාලනාධිකාරිය ක්‍රියාත්මක වන්නේ වෙස්ට් බැංක් කොටසේ සිටය. එහෙත් ගාසා තීරය යනු මුළුමනින්ම එළිමහන් සිරකඳවුරක් ලෙස සැලකිය හැක්කකි. වර්ග කිලෝමිටර් 325ක් පමණ වන, දිගින් කිලෝමීටර් 41ක් දිග 10ක පමණ පළලැති කුඩා බිම් තීරුවකි. වර්ගකිලෝ මීටර් 699කින් යුතු කොළඹ දිස්ත්‍රික්කයත් එමෙන් දෙගුණයක් විශාලය. ඒ අනුව ගාසා හි ප්‍රමාණය ගැන අදහසක් ගත හැකිය. ලොව අධිකම ජනඝනත්වය ඇත්තේ ගාසාවලය. ඒ වර්ග කිලෝමිටරයට 825ක තරම්ය. ඒ කියන්නේ සෑම වර්ගමීටරයකම පාහේ පුද්ගලයකු සිටිනවා යන්නය.




එහෙත් මේ බිම් තීරුව නිදහස් භූමියක් නොවේ. ජාත්‍යන්තර ආධාර උපකාර ඇතිව පලස්තීන් පාලන අධිකාරිය යටතේ මෙහි වෙසෙන ජනතාවගේ මූලික අවශ්‍යතාවයන් සැපිරීම සිදුවුවත් ගසා තීරය ඊශ්‍රායල් මිලිටරි යටත්භාවය යටතේ තිබෙන්නකි. මෙම ජනතා අවශ්‍යතාවයන් ද ඊශ්‍රාලය විසින් අනුමත කරන ලද භාණ්ඩ හා සේවාවන්ට සීමා වේ. ඒ අනුව තහනම් භාණ්ඩ ලැයිස්තුවක්ද ඇත. ගාසා තීරයට ඇතුළුවීමේ පිටවීමේ ස්ථාන තුනක් පමණක් ඇති එය හතර වටින්ම දැවැන්ත කොන්ක්‍රීට් තාප්ප හා කටු කම්බිවලින්, වැටවලින් කොටු කරන ලද ප්‍රදේශයකි. ඒ සීමාවන් අතික්‍රමණය කිරීම ඊශ්‍රායලයේ අවසරය මත පමණක් සිදුවේ. බටහිර දෙසින් මධ්‍යධරණී සාගරය පිහිටා තිබුණද ඒ දෙස බලා සිටිනවා හැර අහලකටවත් යෑමේ නිදහස නැත. මෙහි සියයට 75ක් පමණ සිටින්නේ යුද්ධය නිසා අවතැන් වූ සරණාගතයින්ය. නමුත් ගාසාහී මුල් පදිංචිකරුවන්ගේත් මේ සරණාගතයින්ගේත් වෙනසක් නැත. මේ භූමිය තුළ පලස්තීන විමුක්තිය වෙනුවෙන් වන සංවිධාන ගණනාවක් සක්‍රීය වුවද දේශපාලන බලය අත්පත් කරගෙන තිබෙන්නේ හමාස් සංවිධානය විසින්ය. වෙස්ට් බැංක් කොටස පලස්තීන විමුක්ති සංවිධානය යටතේ වෙයි.

කෙසේ නමුත් ගාසා තීරයේ මිනිසුන් මුහුණ දෙන පීඩාව අනුව ඊශ්‍රායලයට එරෙහිව ගල් මුල් මිස රෝස මල් බලාපොරොත්තු වීම විය නොහැක. යුද ඇවිලීමත් සමග ඊශ්‍රායලය විසින් ගාසා තීරයට විදුලිය, ඉන්ධන, ආහාර, ජලය, ඖෂධ ආදි සැපයුම් සියල්ල නතර කිරීමට පියවර ගැනීම සමඟ ඇති විය හැකි තත්වය ගැන අමුතුවෙන් කිව යුතු ද නැත. මේ මිනිස්සුන්ට අඩු තරමින් ප්‍රදේශයෙන් පළා යන්නට හෝ මුහුදට පැනීමට හෝ අවස්ථාවත් නැත. එවැනි තත්වයක් හමුවේ ඊශ්‍රාලය ගසා තීරයට එල්ල කරන දරුණු ප්‍රහාරයන් හමුවේ සිවිල් වැසියන් මිය යමින් සිටින්නේ තොග වශයෙනි. ඒ අතරම හමාස් සංවිධානය ඊශ්‍රාලයට එල්ල කළ ප්‍රහාරයද දශක ගනනාවකින් එල්ල වූ දරුණුම ප්‍රහාරය බවට පත්ව තිබේ.

විශේෂයෙන්ම ඊශ්‍රායලය ලෝකයේ ප්‍රබලම ආරක්ෂක විධිවිධාන සහිතව ජාතික ආරක්ෂාව සහතික කර තිබෙන රටකි. එසේම ඔවුන්ගේ විදේශ ඔත්තු සේවාව වන **"මොසාඩ්"** ආයතනය යනු ලොවක් බියට පත්කරවීමට සමත් අති දක්ෂ මෙන්ම දරුණු ගණයේ මෙහෙයුම් රැසක් කළ ආයතනයකි. එසේම අභ්‍යන්තර ඔත්තු සේවා වන 'ෂබාක්', 'සින් බෙත්' සහ මිලිටරි ඔත්තු සේවාව වන 'අ මාන්' මඟ හැර මැස්සෙකුටවත් ඉගිලී යා හැකි තත්වයක් තිබුණේ නැත. නමුත් ඊශ්‍රායාලයේ මේ හැකියාවන අභිබවා හමාස් සංවිධානය ඊශ්‍රාලයට ඇතුළු වූයේ විශ්මය ජනක හා දරුණුම ප්‍රහාරයක් සමඟිනි. ගාසා තීරය වටකර ඇති සුවිශේෂි ආරක්ෂක වළල්ල ඊශ්‍රාලය විසින් පැය විසි හතරේ අඛණ්ඩ අධීක්ෂණය යටතේ තිබියදීත් හමාස් සංවිධානය අති විශාල ආයුධ ප්‍රමාණයකින් සන්නද්ධ වීමත් පුදුම සහගතය. එය දීර්ඝ කාලයක් තිස්සේ සිදු කර ඇති බවත් පැහැදිලිය. කෙසේ නමුත් දෙපාර්ශ්වය විසින් මෙතෙක් සිදු කරගෙන ඇති විනාශය මේ හැකියාවන් හෝ ඔවුනොවුන්ගේ යුධ වීරත්වයන් නිසා කිසිසේත්ම නොසලකා හැරිය නොහැක. මේ යුද්ධය ඉතිහාසයට එකතු කර ඇත්තේ මහා ඛේදවාචකයකි. එය තවමත් අවසන් නැත.

කොහොම නමුත් මෙම අර්බුදය විසඳා ගැනීම හදිසි අත්‍යාවශ්‍ය කරුණක්ව තිබේ. මීට පෙර යුගයන්වල මෙය සාමකාමීව විසඳා ගැනීමේ අභිප්‍රායයන් තිබුණද එම අවස්ථාවලින් නියම ප්‍රයෝජනය ගැනීමෙන් වැළැකීමට දෙපාර්ශ්වයම කටයුතු කර ඇත. එසේම කලාපීය සෙසු රාජ්‍යයන් පවා බොහෝ විට කටයුතු කළේ සාමකාමීව සියලු

07 පිටුවට

06 පිටුවෙන්

දෙනාට සාධාරණ විසඳුමක් වෙනුවෙන් නොවේ. ඊට යුක්ති සහගත විවිධ හේතු සියළු පාර්ශ්වයන්ට තිබිය හැකිය. නමුත් වැදගත්ම දේ අනාගතය වෙනුවෙන්, මිනිස් පරපුර වෙනුවෙන් වඩාත් හොඳම විසඳුමක් තෝරා ගැනීමය. ගෝත්‍රික යුගවල මෙන් වර්තමානයේදී ප්‍රශ්න විසඳා ගැනීම විය යුත්තක් නොවේ. ශිෂ්ඨ සම්පන්න පියවරයන් අවශ්‍ය තරම් තිබේ. ලෝකය අත්හදා බලා සාර්ථක කරගත් අත්දැකීම් ද තිබේ. නමුත් මේ කිසිවක් මෙම ගැටළුවේදි වලංගු වී නැත.

ඊශ්‍රායලය යනු යුදෙව් ජාතික ක්‍රිස්තියානින්ගේ රාජ්‍යය ලෙස ස්ථාපිත කර ඇති රාජ්‍යයකි. ඔවුන්ගේ සාම්ප්‍රදායික භූමි ප්‍රදේශයක් ලෙස ඓතිහාසික උරුමයක්ද මෙම ඊශ්‍රායල් භූමියට ඇත. කිතු උපත සිදුවූ ජෙරුසලම ඇත්තේ එහිය. එහෙත් පල්තීන සුන්නි මුස්ලිම් ජාතිකයන්ගෙත් සාම්ප්‍රදායික භූමිය ද මෙම කලාපයය. ඊශ්‍රාලය වෙනම රාජ්‍යයක් ලෙස පිහිටුවීමට පෙර සිටම මෙම ප්‍රදේශයට පලස්තීනුවන් අයිතිවාසිකම් කීවේය. නමුත් ඉතිහාසය තුළ පලස්තීනය යනුවෙන් ද වෙනම රාජ්‍යයක් තිබුණේ නැත. එය වරෙක දකුණු සිරියාව ලෙසත් වරෙක් ජෝර්දානයේ කොටසක් ලෙසත් ආදී ලෙස පැවැතිණි. පළමු ලෝක යුද්ධයෙන් පසුව පලස්තීනුවන්ට වෙනම රාජ්‍යයක වුවමණාව ඇති විය. දෙවන ලෝක යුද්ධයෙන් පසුව බටහිර බලවතුන්ගේ මැදිහත් වීමෙන් ඊශ්‍රායල් රාජ්‍යය බිහිවිය. එතැන් පටන් ජාති හා ආගමික ගැටුමක් ලෙස ද තමන්ගේ භූමිය මුළුමනින්ම අත්පත් කරගැනීම වෙනුවෙන් ද දශක ගණනාවක් මේ දෙපාර්ශ්ව ලේ වැකි යුද්ධවල පැටලී සිටී.

කොහොම නමුත් මේ වන විට ඇවිළ යන යුද්ධය ලෝකයේම යළි අනතුරකට හෙළන්නකි. විශේෂයෙන්ම මැද පෙරදිග සෙසු රටවල් හා ලෝක බලවතුන්ගේ පාර්ශ්වික මැදිහත්වීම් මෙම ගැටුම් උත්සන්න කිරීමට හේතු වුවහොත් ලෝක මට්ටමෙන් ඉන්ධන අර්බුදයක් ඇති වීම වැළැක්විය නොහැක. යුක්‍රේන් රුසියා යුද්ධ විසින් ද ඉන්ධන අර්බුදයෙනුත් එහාට ගොස් ලෝක ආහාර අර්බුදයක් ඇති කිරීමට සමත්ව තිබිණි. ඒ අනුව එම යුධ ගැටුමෙන් බොහෝ දුරස්ථව සිටියත් ශ්‍රී ලංකාව වැනි රටවලට මුහුණ දීමට සිදුවූ ගැටලු නිසා මෙම රටවල් ආර්ථික අර්බුද කරා ගෙන ගියේය. එම අර්බුදවල තිව්‍රතාවයන් විසින් තවත් වසර ගණනාවකට නැගී සිටිමේ හැකියාවද අහෝසි කර ඇත. මේ අනුව ඊශ්‍රායල් පලස්තීන භූමිය පිළිබඳ ගැටළුව එම රටවලට පමණක් අදාල හුදු ගැටළුවක් වන්නේ නැත. ගැටුම්කාරී තත්වය පාලනය කරගැනීමට සමත් නොවුණහොත් විදෙස් සංචිත අර්බුදයක සිටින ශ්‍රී ලංකාව වැනි රටවලට මුහුණ දීමට සිදුවන බරපතලකම මීට වසරකට පෙර ද මෙරට වැසියන් අත්විඳ තිබේ. මේ නිසා මේ ප්‍රශ්න විසඳා ගැනීම විය යුත්තේ සමස්ත ලෝකය ගැන කල්පනා කරය. කලින් කී ලෙස ගෝත්‍රික කල්පනාවන්ට නොගොස් අනාගතය වෙනුවෙන්, මිනිස් පරපුර වෙනුවෙන් වඩාත් හොඳම විසඳුමක් තෝරාගැනීම විය යුතුය. අනෙක අද රාජ්‍යයකට යටත් භූමිය කියන්නේ යල් පැන ගිය සංකල්පයක් වෙමින් පවතින්නකි.

මේ අතර පසුගියදා ජනාධිපති රනිල් යුද ගැටුම විසඳා ගැනීම වෙනුවෙන් අප්‍රිකානු සංගමය විසින් යෝජනා කර ඇති විසඳුම සඳහා යොමු විය යුතු බව පෙන්වා දී තිබිණි.

සාමාජිකයින් 55 දෙනෙකුගෙන් යුත් අප්‍රිකානු සංගමයේ කොමිසමේ ප්‍රධානියා වන Moussa Faki Mahamat ප්‍රකාශයක් නිකුත්කරමින් දෙපාර්ශ්වයෙන්ම ඉල්ලා සිටියේ "**පූර්ව කොන්දේසි නොමැතිව, රාජ්‍යයන් දෙකක් කරටකර ජීවත් වීමේ මූලධර්මය ක්‍රියාවට නැංවීම සඳහා සාකච්ඡා මේසයට ආපසු යන ලෙස**" ය.

තවදුරටත් ජාත්‍යන්තර ප්‍රජාවෙන් සහ විශේෂයෙන්ම ප්‍රධාන ලෝක බලවතුන්ගෙන් ඉල්ලා සිටින්නේ සාමය පැනවීමට සහ ජාතීන් දෙකේ අයිතිවාසිකම් සහතික කිරීමට ඔවුන්ගේ වගකීම් භාර ගන්නා ලෙසයි.

Moussa Faki Mahamat විශ්වාස කරන්නේ මෙය පලස්තීන ජනතාවගේ සහ ඊශ්‍රායල ජනතාවගේ අවශ්‍යතා ආරක්ෂා කරනු ඇති බවයි. එසේම පලස්තීන ජනතාවගේ, විශේෂයෙන්ම ස්වාධීන හා ස්වෛරී රාජ්‍යයක මූලික අයිතීන් ප්‍රතික්ෂේප කිරීම, මගින් ගැටුම් මතුවී ඇති බව අප්‍රිකානු සංගමයේ ප්‍රකාශය තුළින් ඉස්මතු කළේය.

මේ අතර ලෝකයේ බොහෝ රාජ්‍යයන් වෙතින් මෙම ගැටළුව විසඳීම වෙනුවෙන් පෙර යෝජනා කරන ලද 'රාජ්‍ය දෙකේ විසඳුම' වෙත යොමු වන ලෙස ද වහාම සටන් විරාමයක් ද ආයාචනා කර තිබිණි. එසේම ඊශ්‍රායලය සහ පලස්තීනය අතර සාධාරණ සහ පුළුල් සාමයක් සඳහා වූ එක්සත් ජාතීන්ගේ පූර්ව යෝජනා රාශියක ඉල්ලීම් ඉටු කරන විශ්වසනීය සාම ක්‍රියාවලියක් කලාපයට අත්‍යවශ්‍ය වන බවත් පෙන්වාදී තිබිණි.

"රාජ්‍ය දෙකේ විසඳුම"යනු 1937 දී බ්‍රිතාන්‍යයන් විසින් පිහිටුවන ලද පීල් කොමිෂන් සභාව විසින් මෙම ගැටුම් තිව්‍ර වීමට පෙරම යෝජනා කරන ලද්දකි. 1947 දී එක්සත් ජාතීන් විසින් ද මෙම දෙරටම වෙනම ස්වාධීන රාජ්‍යයන් දෙකක් බවට පත් කරලීම වෙනුවෙන් මෙම විසඳුම යෝජනා කරන ලදී.

කෙසේ වෙතත්, ඉන් වසර අසූවක් ඉක්මවා ගියද, එය අපේක්ෂා කළ පූර්ණ විසඳුම කිසි විටෙකත් ඉටු නොවීය. එහෙත් ඊශ්‍රාලය ස්වාධීන රාජ්‍යයක් ලෙස 1948 දී ප්‍රකාශයට පත් කරන ලද අතර එය එක්සත් ජාතීන් විසින් පිළිගනු ලැබීය. නමුත් මෙතැන් පටන් පලස්තීනය ඇතුළු අරාබි පාර්ශ්ව සහ ඊශ්‍රායලය සමඟ යුද ගැටුම් බරපතල ලෙස ඇතිවීම සිදුවිය. කලාපයම යුද පිටියක් විය.

කෙසේ නමුත් තවමත් පලස්තීනය වෙනම රාජ්‍යයක් ලෙස පිළිනොගනී. එය විශේෂ පාලන අධිකාරියක් සහිත යම් තරමක ස්වාධීනත්වයක් සහිත ප්‍රදේශයකි. 1993 දී ඊශ්‍රායල රජය සහ පලස්තීන විමුක්ති සංවිධානය (PLO) ඔස්ලෝ ගිවිසුමේ කොටසක් ලෙස රාජ්‍ය දෙකේ විසඳුමක් ක්‍රියාත්මක කිරීමේ සැලැස්මකට එකඟ වීමෙන් පසුව, පලස්තීන පාලන අධිකාරිය පිහිටුවීම සිදු විය. එහෙත් පලස්තීන පාලන අධිකාරිය යටතේ වන ප්‍රදේශය පවතින්නේ ඊශ්‍රායලය හරහා බෙදුණු ප්‍රදේශ දෙකක් ලෙස වීමත් මෙම අර්බුද නිරාකරණයට අසීරු වී තිබේ. එම නිසා පලස්තීනයට එහි කටයුතු තීරණය කිරීමේදී ඊශ්‍රායලයේ බලපෑම් එල්ලවිය. විශේෂයෙන්ම ඉහත ද සඳහන් කළ ලෙස ගාසා තීරය ඊශ්‍රායල් අත්අඩංගුවේ පසුවන ප්‍රණ ඇපකරුවෙක් තත්වයේ පවතී.

මෙම ඔස්ලෝ ගිවිසුම අත්සන් කිරීම ඊශ්‍රායල-පලස්තීන සබඳතාවයේ ඓතිහාසික සන්ධිස්ථානයක් විය. මෙම ක්‍රියාවලිය ආරම්භයේදී ප්‍රගතියක් පෙන්නුම් කළද, අතෘප්තිය සහ අවිශ්වාසය මත ක්‍රියාවලියේ බිඳ වැටීමට හා ප්‍රමාදයට හේතු විය. කොහොම නමුත් පලස්තීන ස්වාධීන රාජ්‍යයන් වෙනුවෙන් සටන් වැද සිටින විමුක්තිකාමී සන්නද්ධ සංවිධාන වන හමාස්, හිස්බුල්ලා සහ තවත් සංවිධාන ගණනාවක් මෙම රාජ්‍ය දෙකේ විසඳුම පිළිගැනීමට සූදානම් නැත. මන්ද ප්‍රධාන වශයෙන් එමඟින් යෝජිත පලස්තීනය යනු ඔවුන්ගේ සාම්ප්‍රදායික භූමියෙන් විශාල කොටසක් අහිමි වීමක් නිසාය.

ඒ අතර යළි ප්‍රචණ්ඩත්වයන් වර්ධනය වූ අතර 2008න් පසු නැවත සාකච්ඡා ආරම්භ කිරීම දුෂ්කර විය. හමාස් සංවිධානය යනු පලස්තීන විමුක්ති සංවිධානය යනුවෙන් වන සන්ධානයේ සිට පසුව එයින් වෙන්ව කටයුතු කරන සන්නද්ධ සංවිධානයකි. රාජ්‍ය දෙකක විසඳුමක් ප්‍රතික්ෂේප කළ හමාස් සංවිධානය එම වකවානුවේදීම මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර එල්ලකරමින් ප්‍රචණ්ඩකාරිත්වයන් ආරම්භ කළේය. එම මතය හා සිටින පලස්තීනුවන්ගෙන් බහුතරයක් පවසන්නේ, 1967ට පෙර පැවැති දේශ සීමා අනුව ඓතිහාසික පලස්තීනය නැවත ලබා ගැනීමට අවශ්‍ය බවයි.

එමෙන්ම පාලකයන් විසින් යම් සාමකාමී විසඳුමක් වෙත අවතීරණය වුවද මෙම ගිවිසුමේ ආරම්භයේ සිටම බොහෝ ඊශ්‍රායල සහ පලස්තීන ජාතිකයන් දෙරටේ විසඳුම කඩාකප්පල් කිරීමට උත්සාහ කළහ. දෙපාර්ශ්වයේම ආගමික ජාතිකවාදීන් විශ්වාස කළේ තම පාලකයන්ට භූමියෙන් කොටසක් ලබා දීමට අයිතියක් නොමැති බවයි. ජනමත විමසුම් වලින් දෙපාර්ශවයේම බහුතරය මෙම විසඳුම ප්‍රතික්ෂේප කරයි. මෙම ගැටළුව සිරවී ඇති ප්‍රධාන සංධිස්ථානය මෙතැනය. මෑත කාලීනවත් ගැටළුව විසඳීම වෙනුවෙන් ජාත්‍යන්තර මැදිහත්වීම් රැසක් ඇති වුණද ඒ කිසිවක් සාර්ථක වුයේ ද නැත. යළි යුද්ධය ඇවිලෙන්නේ රාජ්‍ය දෙකක විසඳුමක මේසය මත තිබියදීය.

කොහොම වෙතත් ලෝක බලවතුන්ගේ මැදිහත්වීම පසෙක තබා කලාපීය ප්‍රශ්නයක් ලෙස අප්‍රිකානු සහ අරාබි කලාපීය රටවල මැදිහත් වීමෙන් විසඳුම් සොයාගත හැකි වන්නේ නම් එය වඩා කල් පවත්නා විසඳුමකට මග විය හැකිය. මන්ද කලාපීය සහයෝගිතාවය ඒකබද්ධතාවය මෙහිදී ප්‍රමුඛ කරගත හැකි නිසාය. එහෙත් ඇතැම් රාජ්‍යයන් පෙන්නුම් කරමින් තිබෙන්නේ යුද්ධයටම ආවඩන ක්‍රියාකාරිත්වයක්වීම මෑතක මෙම ප්‍රශ්නය විසඳෙනු ඇතැයි සිතන්නට ඉඩ නොදේ.

> **ඊශ්‍රායලය යනු යුදෙව් ජාතික ක්‍රිස්තියානින්ගේ රාජ්‍යය ලෙස ස්ථාපිත කර ඇති රාජ්‍යයකි. ඔවුන්ගේ සාම්ප්‍රදායික භූමි ප්‍රදේශයක් ලෙස ඓතිහාසික උරුමයක්ද මෙම ඊශ්‍රායල් භූමියට ඇත. කිතු උපත සිදුවූ ජෙරුසලම ඇත්තේ එහිය. එහෙත් පල්තීන සුන්නි මුස්ලිම් ජාතිකයන්ගෙත් සාම්ප්‍රදායික භූමිය ද මෙම කලාපයය. ඊශ්‍රාලය වෙනම රාජ්‍යයක් ලෙස පිහිටුවීමට පෙර සිටම මෙම ප්‍රදේශයට පලස්තීනුවන් අයිතිවාසිකම් කීවේය. නමුත් ඉතිහාසය තුළ පලස්තීනය යනුවෙන් ද වෙනම රාජ්‍යයක් තිබුණේ නැත. එය වරෙක දකුණු සිරියාව ලෙසත් වරෙක් ජෝර්දානයේ කොටසක් ලෙසත් ආදී ලෙස පැවැතිණි. පළමු ලෝක යුද්ධයෙන් පසුව පලස්තීනුවන්ට වෙනම රාජ්‍යයක වුවමණාව ඇති විය. දෙවන ලෝක යුද්ධයෙන් පසුව බටහිර බලවතුන්ගේ මැදිහත් වීමෙන් ඊශ්‍රායල් රාජ්‍යය බිහිවිය. එතැන් පටන් ජාති හා ආගමික ගැටුමක් ලෙස ද තමන්ගේ භූමිය මුළුමනින්ම අත්පත් කරගැනීම වෙනුවෙන් ද දශක ගණනාවක් මේ දෙපාර්ශ්ව ලේ වැකි යුද්ධවල පැටලී සිටී.**

මෙම ගැටළුව විසදාගැනීම වෙනුවෙන් රාජ්‍ය දෙකේ විසඳුමට විකල්පව, ඒකීය රාජ්‍යයක් තුළ ද්විත්ව තන්ත්‍ර ෆෙඩරල්වාදී විසඳුමක්ද ඉදිරිපත්ව තිබේ.

ඒ අතර තවත් විකල්පයක් ලෙස තුන් රාජ්‍ය විසඳුම යෝජනා වී ඇත. ඒ අනුව ගාසා තීරයේ වගකීම ඊජිප්තුවට සහ වෙස්ට් බැංක් හී වගකීම ජෝර්දානයට පැවැරීමය.

තවත් යෝජනාවක් ලෙස ද්විත්ව පුරවැසිභාවය පිළිබඳ යෝජනාව ඉදිරිපත්ව ඇත. ඒ අනුව පලස්තීනුවන්ට ඊශ්‍රායලයේ ජීවත් වන්න පුරවැසිභාවය හෝ නේවාසික බලපත්‍ර ලබා දීම සේම, යුදෙව්වන්ට පලස්තීනයේ ජීවත් වීමට පුරවැසිභාවය හෝ නේවාසික බලපත්‍ර ලබා දීමය.

සාමකාමී විසඳුම් යෝජනා ගණනාවක් ඉදිරිපත්ව තිබුණද තෝරාගැනීම සිදුවන්නේ ම්ලේච්ඡ යුධමය භාවිතය තුළින් නම් විය හැක්කේ ගාසා තීරය සමුහ මිනීවළක් බවට පත් කිරීමේ ඊශ්‍රායලයේ වුවමණාව සැපිරීමය. එමෙන්ම හමාස් සංවිධානයේ මරාගෙන මැරෙන ප්‍රහාර හමුවේ සිවිල් පුරවැසියන්ගේ මළකඳන් ඊශ්‍රායලයට දරාගැනීමට ලෙහෙසි නොවනු ද ඇත. මේ යුද්ධය, මළකඳන් ගණන් කිරීමෙන් ප්‍රශ්නවලට විසඳුම් සෙවීමේ ගෝත්‍රික ක්‍රමය තවමත් පරණ නැති බව, මේ දෙපාර්ශවයම විසින්ම ඔප්පු කරන්න දැගලීමක් කිව්වත් වැරදි නැත.

ජයතුංග බණ්ඩාර



2024 අයවැයට පෙර II

# ඇඳුම බලලා බදු නොගහන ක්‍රමයක්



"අපේ රටේ බදු ගහන්නේ ඇඳුම බලලා" මේක කීවේ බදු පරිපාලනයට සම්බන්ධ මගේ මිත්‍රයෙක්. මේ කථාවෙන් ඔහු කියන්නේ වැදගත් කරුණක්. වෘත්තිකයින් හා පිළිගත් ව්‍යාපාරිකයින් පසුපස පන්නා ගොස් බදු දැල එළීමට බදු නිලධාරින් උත්සාහ කළද, එයට වඩා වැඩි පිරිසක් බදු ගෙවිය යුතු නමුත් බදු නොගෙවා මඟහැර සිටින බවය. තවද ඇඳුම හොඳට පිළිවෙලට අඳින සියළු දෙනාද බදු දැලෙන් රිංගන බව තේරුම්ගත යුතුය. එනම් බදු ගෙවිය යුතු නමුත් බදු නොගෙවා සිටින හා බදු ගෙවන නමුත් ආදායමෙන් කොටසක් සඟවන පිරිස් සිටින බව අමතක නොකළ යුතුය.

සෘජු බදු ගෙවීම ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වී ප්‍රකාශ කරන කාර්යයක් ලෙස මෙරට ක්‍රියාත්මක වන නිසා බදු නොගෙවා සිටින පිරිස වැඩිය. එමෙන්ම බදු නීති-රීතිවල ලිහිල්භාවය නිසා බදු ගෙවීමට අනුකූලතාවය නොදක්වන පිරිසද වැඩිය. මේ නිසා බදු ක්‍රමයට බදු ගෙවිය යුත්තන් අන්තර්ග්‍රහණය කර ගැනීමට නම්, මීට වඩා වෙනස් ක්‍රමවේදයන් බදු පරිපාලනයේදී අවශ්‍ය වන්නේය. ඒ අනුව, බදු ප්‍රතිපත්තීන් සැකසීමේදී ආර්ථිකයේ විධිමත් අංශය ඉලක්ක කිරීමට අමතරව අවිධිමත් අංශය ඉලක්ක කිරීමටද වැඩපිළිවෙළක් තිබිය යුතුය.

## නීත්‍යානුකූල නමුත් අවිධිමත් ආර්ථික කටයුතු

මේ සඳහා ගත හැකි ක්‍රියාමාර්ග කීපයක් පසුගිය අයවැය දෙකකදී ඉදිරිපත් කරන ලදී. එනම් 2018න් පසුව ඉඩමක් මිලට ගත් සියළු දෙනා බදු ලිපිගොනුවක් ආරම්භ කිරීම, මොටර් බයිසිකල්, ත්‍රීවිල් හා අත් ට්‍රැක්ටර් හැර අනෙක් වාහන ඇති සියළු දෙනාම බදු ලිපිගොනු ආරම්භ කිරීම, 2023 අප්‍රේල් 01 සිට ක්‍රියාත්මක වන පරිදි ඉතුරුම් මත ලැබෙන පොලී ආදායමෙන් 5%ක රඳවා ගැනීමේ බද්දක් පැනවීම, 2024 ජනවාරි 01 වනදායින් පසුව වයස අවුරුදු 18ට වැඩි සියළු දෙනාම බදු සඳහා ලියාපදිංචිවීම වැනි අයවැය යෝජනා ඒ අතර විය. මේ තුළින් රජය අපේක්ෂා කරන්නේ බදු ගෙවිය යුතු සියළු දෙනාම බදු ක්‍රමයට අන්තර්ග්‍රහණය කර ගැනීමය. නැතිනම් බදු පදනම පුළුල් කිරීමය.

බදු පරිපාලනය ගැන සාකච්ඡා කළ පසුගිය කලාපයේ '2024 අයවැයට පෙර' මැයෙන් පළවූ පලමු ලිපියෙන් "විධිමත් ආර්ථිකයේ" බදු පරිපාලනයේදී ගත හැකි යම් යම් කරුණු කෙරෙහි අවධානය යොමු කරන ලදී. මෙම ලිපියෙන් අපේක්ෂා කරන්නේ නව නීති ගෙන ඒම නොව පවතින නීති යටතේ බදු පදනම පුළුල් කිරීමේදී "අවිධිමත් ආර්ථික කටයුතු" ආශ්‍රිතව බදු පරිපාලනය ඇස ගැසිය යුතු තැන් ගැන යම් අදහසක් දැක්වීමටය.

ඕනෑම රටක ආර්ථිකයේ අවිධිමත් ආර්ථික කටයුතු හා විධිමත් ආර්ථික කටයුතු සිදුවේ. ජාතික ගිණුම්කරුවන්, ජාතික ගිණුම් සැකසීමේදී ආර්ථිකයේ සැඟවුණු ආර්ථික ක්‍රියා වශයෙන් හඳුන්වන කොටසක් ඇත්තේ ඒ නිසාය. මෙහි අවිධිමත් ආර්ථිකය යනු වෙළෙඳපොල ඉලක්කකර නීත්‍යානුකූලව නිෂ්පාදනයේ යෙදෙන සේවා සපයන නමුත් රාජ්‍ය රෙගුලාසිවලට අනුකූල නොවන හෝ එම රෙගුලාසි මඟහැර සිදුකරන ආර්ථික ක්‍රියාවලීන්ය. එනම් ජාතික ආදායම සැකසීමේදී ගිණුම්ගත වියයුතු නමුත් එසේ ගිණුම් ගතවීමට අවශ්‍ය තොරතුරු බදු ගිණුම් සැකසුම්කරුවන්ට ලබා නොදෙන ව්‍යාපාර කටයුතුය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අධ්‍යනයන්ට අනුව, අවිධිමත් ආර්ථිකය යනු ගෝලීය සංසිද්ධියකි. සාමාන්‍යයෙන්, එය අඩු සහ මධ්‍යම ආදායම් ලබන රටවල දළ දේශීය නිෂ්පාදිතයෙන් 35%ක් සහ දියුණු ආර්ථිකයන්හි 15%ක් නියෝජනය කරයි. ජාත්‍යන්තර කම්කරු සංවිධානය ඇස්තමේන්තු කරන්නේ කම්කරුවන් බිලියන 2ක් පමණ හෙවත් ලෝකයේ වැඩිහිටි ශ්‍රම බලකායෙන් 60%කට වඩා වැඩි පිරිසක් අවිධිමත් අංශයේ සේවා නියුක්ත බවය.

## ධනය රැස්කිරීම හෝ අධි පරිභෝජනය

රටක ආර්ථිකයක් හැසිරවීම රජයේ වගකීමකි. එහිදී විවිධ ආර්ථික ක්‍රියාවන්වලින් සමාජයට ඇතිවන බලපෑම පාලනය කිරීමට රජය විසින් විවිධ රෙගුලාසි ක්‍රියාත්මක කරයි. ඒ අනුව රජය විසින් බදු පැනවීම මගින් සිදු කරන්නේද එවැනි රෙගුලාසි ක්‍රියාත්මක කිරීමකි. ඒ අනුව රටක බදු ප්‍රතිපත්තියේ එක් අරමුණක් වන්නේ, බදු ක්‍රමය ආර්ථිකය පාලනය කරන උපකරණයක් ලෙස භාවිතා කරමින් රජය විසින් පුද්ගලයින්ගේ පරිභෝජනයට, නිෂ්පාදනයට, ඉතුරුම් හා ආයෝජනවලට බලපෑම් කිරීමය. ඒ තුළින් ආර්ථිකය සමාජ වුවමනාවන්ට ගැලපෙන ආකාරයට හැඩ ගැස්සවීමට ක්‍රියා කරයි. එය සෘජු බදු හෝ වක්‍ර බදු ක්‍රමයක් විය හැකිය. සෘජු බදු මගින් තනි තනි පුද්ගලයින්ගේ ආදායමට බලපෑම් කරන අතර ඒ තුළින් ඔවුන්ගේ පරිභෝජනය, ඇතුළු ආර්ථික ක්‍රියාවන්ට සෘජුවම බලපෑම් කළ හැකිය. වක්‍ර බදු මගින් එයට වෙනස්ව, සමස්ත සමාජයේම පරිභෝජනය, නිෂ්පාදනය හා සේවා සැපයුම වැනි ආර්ථික ක්‍රියා මත බලපෑම් කිරීමට පුළුවන.

සමාජයක පුද්ගලයින්ගේ ආදායම මත බදු පනවා ඔවුන්ගේ ආර්ථික ක්‍රියාවලට බලපෑම් කරන්නේ ඇයි? යන ගැටළුවත්, මේ නිසා පුද්ගලයින් ව්‍යාපාර කිරීමට ඇති නැඹුරුව අඩුවන්නේය නැතිනම් ආර්ථිකය හැකිලෙන්නේය යන ගැටළුවත් සාමාන්‍යයෙන් අසන්නට ලැබෙන කථිකාවකි. ආදායම යනු පුද්ගලයන් වැටුප් ලෙස හෝ ව්‍යාපාරයකින් ලාභය ලෙස කරන ඉපයීමයි. බදු පැනවීම මගින් කරන්නේ මෙම ඉපයීම්වලින් සිදුවන සමාජයට අහිතකර ලෙස ධනය රැස්කිරීම හෝ අධි පරිභෝජනය පාලනය කිරීමකි. මෙහිදී බද්දට යටත්වන පුද්ගලයාගෙන් ඉවත්වන මුදල් ප්‍රමාණය රාජ්‍ය ආදායම බවට පත්වී නැවත එය සමාජය ඉලක්ක කරගත් වියදමක් බවට පත්වේ. එනම් බදු ප්‍රතිපත්තියේ දෙවන අරමුණ වන්නේ, රාජ්‍ය ආදායම් ලැබීම හා ඒ හරහා රාජ්‍ය වියදම් දැරීමය.

## අවිධිමත් ආර්ථික අංශයේ හැසිරීම

වර්තමාන පුද්ගල ආදායම් බදු ක්‍රමය යටතේ වාර්ෂික ආදායමෙන් රුපියල් ලක්ෂ 12ක් බදුවලින් නිදහස් වන අතර, ඉන් පසුව විවිධ බදු අනුපාත පවතින අතර රුපියල් ලක්ෂ 25ක් දක්වා ඉක්මවන සෑම ආදායමක් සඳහාම 36%ක් බදු ප්‍රතිශතයක් ගෙවීම අවශ්‍ය වේ. මේ නිසා අදාල ව්‍යාපාරයකින් ආදායම් උපයන්නට එම ආදායම තම ව්‍යාපාරයේ අභිවෘද්ධිය වෙනුවෙන් නැවත ආයෝජනය කිරීමෙන්, සේවක වැටුප් දීමනා ඉහළ දැමීමෙන් ව්‍යාපාරයේ කාර්යක්ෂමතාවය ඇති කර ගැනීමට හැකි ලෙස එය වියදමක් බවට පත් කිරීමට පුළුවන. මේ නිසා ඉහළ බදු ප්‍රතිශතයක් ගෙවීම වෙනුවට ආයෝජනය මගින් ව්‍යාපාරය ව්‍යාප්ත කිරීමට හැකිවීමෙන් ඇතිවන්නේ සමාජයට යහපතකි. එමගින් තවත් රැකියා අවස්ථා බිහිවීම මෙන්ම එම ව්‍යාපාරය වටා ඇතිවන ආර්ථික ක්‍රියා හේතුවෙන් විවිධ ප්‍රතිලාභ හිමිවන්නේ සමාජයටය.

අවිධිමත් අංශයේ ඉපයීම් බදු ගිණුම්කරණයට බොහෝවිට හසුවන්නේ නැති බැවින් එම පිරිස කරන ඉපයීම්වලින් බදු ආදායමක් රජයට නොලැබීම දැකිය හැකි කරුණකි. එහිදී එක්කෝ ගෙවිය යුතු බදුවලින් කොටසක් ගෙවමින් තවත් කොටසක් මඟහැරීම තුළ අවිධිමත් ආර්ථික ක්‍රියාවකට ඔවුන් යොමුවී ඇත. නැතිනම් එම වෘත්තියේ යෙදෙන අයගෙන් කොටසක් බදු ගෙවන අතර එයින් පිරිසක් බදු නොගෙවීමෙන් සිදු වන්නේ ද එකම වෘත්තිය තුළ විධිමත් හා අවිධිමත් අංශ දෙකම ක්‍රියාත්මක වීමය. උදාහරණ වශයෙන් නීතිඥයින්, වෛද්‍යවරුන්, උපකාරක පන්ති ගුරුවරුන් මෙම කාරණයේදී සමාජයේ ප්‍රචලිත කණ්ඩායම්ය.

## ආදායම වෙනුවට වියදම මතට බදු

විශේෂයෙන්ම පසුගියදා රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය සෞඛ්‍ය අමාත්‍යංශය ඉදිරිපිටට පැමිණියේ විවිධ හේතු දක්වන උද්ඝෝෂණ පුවරු රැගෙන වුවද, ඔවුන්ගේ යටි අරමුණුගත ඉල්ලීම වන්නේ ඔවුන්ගේ වැටුප මත ඇතිකර තිබෙන බදු බර අඩුකර ගැනීමය. මෙය වෛද්‍යවරුන් පමණක් නොව විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, බැංකුකරුවන් මෙන්ම තවත් ක්ෂේත්‍ර කීපයක ඉහළ වැටුප් ලබන සේවා නියුක්තිකයින්ගේ ඉල්ලීම බවට පත්ව ඇත. මෙම ඉල්ලීම් කිසිම ආකාරයකින් අසාධාරණ ඉල්ලීම් ලෙස දැක්වීමක් ලෙස තර්ක කිරීම මෙම ලිපියේ අරමුණ නොවන්නේය. ඇතැම්විට මෙම ඉහළ වැටුප් ලබන සේවාවන්හි නියුතු සේවා නියුක්තිකයින් සිය වෘත්තීය ආදායමෙන් පිටත කිසිදු අමතර ආදායමක් නොලබන්නේ නම් සුපුරුදු ජන ජීවිතය පවත්වාගෙන යාමට නොහැකිවන බව පිළිගැනීම වැදගත්ය.

අවිධිමත් අංශයෙන් බදු රැස්කිරීම සම්බන්ධයෙන් විවිධ ක්‍රම ලෝකයේ රටවල් අනුගමනය කරන්නේ මෙම අංශයේ බදු ගෙවිය යුතු නමුත් බදු නොගෙවන අය අතිවිශාල ප්‍රමාණයක් සිටින නිසාය. මේ සඳහා 'ආදායම' මිණුමක් ලෙස යොදා ගැනීමට නොහැකි නිසා වෙනත් මිණුම් නැතිනම් නිර්නායක භාවිතා කිරීමට පුළුවන. එනම්, පුද්ගලයින් කරන 'වියදම්' නිර්ණායකයක් ලෙස භාවිතා කිරීම විකල්ප ක්‍රමයකි. එහිදී මුදල් ගනුදෙනු සඳහා කාඩ්පත් භාවිතයට නැඹුරු කිරීම හා යම් සීමාවකින් ඉහළ සියළු මුදල් ගනුදෙනු බැංකු හරහා සිදු කිරීමට නීති ගෙන ඒම එක් ක්‍රමයකි. දැනට මෙරට නීතිය වන්නේද රුපියල් ලක්ෂ 05 වැඩි සියළු ගනුදෙනු බැංකු හරහා සිදු කළ යුතු බවය. පාරිභෝගික භාණ්ඩ මිලට ගැනීමේදී රුපියල් 50000ට වඩා වැඩි ගෙවීම් කාඩ්පත් මගින් ගෙවීමට ක්‍රමවේද සැකසීම තවත් ක්‍රමයකි. මෙයට අමතරව වාහන අංකයට අදාලව ඉන්ධන භාවිතා කරන ප්‍රමාණය සැලකිල්ලට ගැනීම මෙන්ම විදුලිය, ජලය හා සංනිවේදන බිල්පත් සැලකිල්ලට ගැනීම වියදම මත බදු අයකිරීම වෙනුවෙන් භාවිතා කළ හැකි මිණුම් දණ්ඩය.

## අනුකම්පාව මත බදු දැලෙන් රිංගා යාම

මෙසේ බදු නොගෙවන නමුත් බදු අය කළ යුතු පාර්ශවයන් හඹා යාම වෙනුවට බදු ගෙවන පුද්ගලයින් මතම පීඩනය ඇති කිරීමත්, පහසුවෙන් බදු අය කරගත හැකි මාර්ගයන්ගෙන් පමණක් බදු අයකිරීමත් බදු පරිපාලකයින්ගේ අවධානයට යොමු වන නිසා ඇතිවන්නේ බදු සම්බන්ධ සාධාරණත්වයක් නොමැතිවීමය. පසුගිය අයවැයෙන් යෝජනා වූ රඳවා ගැනීමේ බද්ද ලබාගැනීම හැරෙන්නට ඒ මත පදනම්ව පුද්ගලයින්ගේ සැබෑ ආදායම සොයා සත්‍ය බදු ප්‍රමාණය කොපමණද යන්න ගණනය කරන වැඩපිළිවෙලක් තවමත් ක්‍රියාත්මක නැත.

මුදල් රාජ්‍ය අමාත්‍යවරයා රාජ්‍ය ආදායම් රැස්කරන ආයතන කැඳවා ප්‍රකාශ කළේ නව බදු පැනවීම් වෙනුවට බදු පදනම පුළුල් කරන ලෙසය. එය දැනට පවතින නීතිය යටතේ කළ හැකිය. එයින් දැනට බදු ගෙවනන්ටද ඇති කරන්නේ බදු ක්‍රමය පිළිබඳ විශ්වාසයකි. අයවැයෙන් යෝජනා වූ පරිදි සමාජයේ විවිධ කණ්ඩායම් ඉලක්ක කර බදු ලිපිගොනු විවෘත කිරීම තවත් ක්‍රියාත්මක නැත. මෙම තත්ත්වය හමුවේ ආර්ථිකයේ අවිධිමත් අංශයේ ආදායම් ඉපයීම් මත බදු පැනවීම සම්බන්ධයෙන් කතා කිරීමද විහිළුවක් වනු ඇත.

සාමාන්‍යයෙන් ස්ථිර ව්‍යාපාර ස්ථානයක් නොමැතිව පොළ ක්‍රමය තුළ හෝ ජංගම රථ තුළ වෙළඳමේ යෙදෙන පුද්ගලයින්ගේ ව්‍යාපාර කටයුතු බදු ක්‍රමයට හසු නොවන්නේ එම ව්‍යාපාර බදු ක්‍රමයකට අන්තර්ග්‍රහණ කළ ගත හැකි ආකාරයෙන් ව්‍යාපාර කටයුතු නොකරන බැවිනි. ඔවුන් ජංගම වෙළෙන්දන් ලෙස කටයුතු කිරීම නිසා ද බදු ක්‍රමයට ග්‍රහණය කරගැනීමට නොහැකිය. මෙහිදී තවත් තර්කයක් ලෙස ගෙන එන්නේ මෙවැනි ව්‍යාපාරික තීරුවල ආදායම ඉතා පහළ මට්ටමක පවතින බැවින් ඔවුන්ගේ ආදායම මත බදු පැනවීමක් අසාධාරණ හෝ අයුක්ති සහගත බවකි. එය අනුකම්පාව මත බදු දැලෙන් රිංගා යමකි. එහි ප්‍රායෝගිකත්වය නිරීක්ෂණය කිරීමට ක්‍රමවේදයක් නොමැති නිසා සත්‍ය ආදායම නිරූපනය නොවේ.

මෙය මා ලිපිය ආරම්භයේදීම සඳහන් කළ 'අපේ රටේ බදු ගහන්නේ ඇඳුම බලලා' යන කියමනට උදාහරණයක් මෙසේය. මා මිත්‍ර මාධ්‍යවේදියෙක් සමඟ සාකච්ඡා කරන විට ඔහු ගෙන හැරපෑ උදාහරණය ඊට කදිම නිදසුනකි. මා හිතවත සුපුරුදු ලෙස එළවලු මිලට ගන්න එළවලු තට්ටුවක් පවත්වාගෙන යන වෙළෙන්දා සමඟ දිනක් සතුටු සාමීචියක යෙදී සිටින විට ඔහු ප්‍රකාශ කර ඇත්තේ සිය පවුලේ උදේ ආහාර වේල සඳහා පමණක් රුපියල් 5,000ක් පමණ දෛනිකව වියදම කරන බවය. ඒ ඔහුගේ ජීවන රටාවය. එම වියදම දෛනිකව දරණ පුද්ගලයෙක්ගේ මාසික ආදායම අනිවාර්යයෙන්ම රුපියල් 100,000 ඉක්මවීම අනිවාර්යය. නමුත් තට්ටුවක හෝ බිම එළවළු දාගෙන වෙළෙඳාමේ යෙදෙන මෙවැනි පුද්ගලයින්ගේ ව්‍යාපාරික හැඩරුවම ඔවුන් බදු ක්‍රමයෙන් බැහැර කිරීමට මාර්ග යක් කර ගනී. මෙහිදී කිසිම ආකාරයකින් ඔහුගේ ආදායම මත බදු පැනවීමක් සිදුකළ නොහැකිය. තවත් හේතුවක් වන්නේ, ඔවුන් තොග මිලට ගැනීම් හා නැවත සිල්ලර වෙළඳාම කරන්නේ අත් පිට මුදලට මිස බැංකු මාර්ගයෙන් නොවන නිසා ඔවුන්ගේ ව්‍යාපාරවල දෛනික පිරිවැටුම හෝ ඔවුන්ගේ ලාභයේ ප්‍රමාණය සටහන්වීමක් සිදුවන්නේ නැත. එමෙන්ම අධික පරිභෝජනය නිසා ලාභය මත කරන ඉතුරුම් මෙම සමාජ කණ්ඩායම්වල පැහැදිලි නැත. නමුත් ඔවුන් ලාභය ලෙස බදු ගෙවිය යුතු ආදායමක් ලබයි. එහෙත් බදු ගෙවන්නේ නැත.

මේ ආකාරයට ගත්විට බදු ක්‍රමය වඩාත් සංවිධිත කිරීම අවශ්‍යය. මෙය කවුරු ආණ්ඩු කළද ආර්ථිකයේ විය යුතු පරිවර්තනයකි. අප ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කියන දේ නොකර එම වැඩ පිළිවෙලින් ඉවත් වුවද රාජ්‍ය ආදායම ඉහළ නංවා ගැනීම වැදගත්ය. සියළු රාජ්‍ය වියදම් සඳහා වැදගත් මූල්‍ය ප්‍රවාහය රජයට ලැබෙන්නේ බදු හා බදු නොවන ආදායම්වලිනි. බදු නොවන ආදායම් ලැබෙන ප්‍රධාන ප්‍රවාහයන් වන රාජ්‍ය ව්‍යවසායන් වැඩි ප්‍රමාණයක් මේ වන විටත් පාඩු ලබන ඒවා නිසා බදු නොවන රාජ්‍ය ආදායම වර්තමානයේ නොගැනිය හැකි ප්‍රමාණයකි. මේ නිසා සමාජයේ අවිධිමත් ආර්ථික කටයුතු ද ඉලක්ක වන ලෙස බදු පදනම පුළුල් කිරීමටත් ඒ තුළින් මෙතෙක් අතහැරී ඇති බදු ආදායම ලබා ගැනීමටත්, හැකි ලෙස බදු පදනම පුළුල් කිරීමට 2024 අයවැය යෝජනා සැකසීම වැදගත්ය.

සරත් හේවගේ

# ගුවන් සේවය බිඳ වැට්ටවීමේ උත්සාහයක් තිබෙනවාද?

## වරාය නාවික හා ගුවන් සේවා අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා



පසුගියදා ගුවන් යානා කිහිපයක් හදිස්සියේ ගොඩබෑම හේතුවෙන් ශ්‍රී ලංකන් ගුවන් සේවයේ ගුවන් ගමන්වලට බාධා එල්ල වුණා. මෙය කාර්මික දෝෂයක් නිසා සිදු වූවක් බව වෘත්තීය සමිති ප්‍රකාශ කළා. නමුත් ගුවන් නියමුවෙකුට ඉංජිනේරුවන්ගේ සහතිකයක් නොමැතිව ගුවන් යානයක් ගුවන් ගත කළ නොහැකියි. කාර්මික දෝෂ තිබේ නම් ගුවන්යානා ගුවන් ගත කරන්නේ නැහැ.

මේක කඩාකප්පල්කාරී තත්ත්වයක්. මේ හේතුවෙන් ගුවන් සේවයට ඇමෙරිකානු ඩොලර් මිලියන 6ක පාඩුවක් වුණා.

ගුවන් නියමුවෙකුට මසකට ඩොලර් මිලියන 4ක් පමණ ගෙවනවා. එම නිසා විවිධ චෝදනා සිදු නොකර ආයතනයක් හැටියට සාර්ථකව ඉදිරියට යාමට තම තමන්ගේ කැපවීම ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඒ සඳහා සේවකයන්ගේ ආකල්ප ද වෙනස් විය යුතුයි. ඒ වගේම ගුවන් නියමුවෙකුට රුපියල් මිලියන 4ක, (ලක්ෂ 40ක) මාසික වේතනයක් ලබා දෙනවා. නමුත් ඔවුන් ලෝකයේ දියුණු ගුවන් සමාගම් ලබාදෙන ඉහළ වැටුප් පෙන්වමින් වැඩි වැටුපක් ඉල්ලා සිටිනවා. නමුත් මේ මොහොතේ එවැනි වැටුප් වැඩිවීමක් ලබාදීමට හැකියාවක් නැහැ.

අපේ ගුවන් නියමුවන්ගෙන් බොහෝ දෙනෙක් මසකට පියාසර කර ඇත්තේ පැය 63ක් පමණයි. ඒක ප්‍රමාණවත් නැහැ. යුරෝපීය සහ එක්සත් ජනපද ආරක්ෂක රෙගුලාසි යටතේ නියමුවන්ට වසරකට පැය 900 සිට 1000 දක්වා පියාසර කළ යුතුයි. ඒ නිසා මම හැමෝගෙන්ම ඉල්ලා සිටින්නේ ආයතනයට සහයෝගය දෙන ලෙසයි.

මේ දුෂ්කරතා මධ්‍යයේ වුවත් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල නවීන තාක්ෂණය යොදා ගෙන සංවර්ධනය කිරීම නිසා අන්තර් ජාතික ගුවන් සේවා අධිකාරිය විසින් එය අග්නිදිග ආසියාවේ ප්‍රධානම ගුවන් තොටුපළක් බවට නම් කිරීමට කටයුතු කර තිබෙනවා. ඒ සමඟම ශ්‍රී ලංකාවට පැමිණෙමින් තිබූ විවිධ ගුවන් සමාගම්වලට අයත් ගුවන් යානාවල වාර ගණන වැඩි කිරීමට ඔවුන් කටයුතු කළා.

ඒ අනුව එමිරේට්ස් ගුවන්යානා සතියකට ගුවන් ගමන් වාර 28ක්, චයිනා ඊස්ටන් එයාර් සතියකට ගුවන් ගමන් වාර 05ක්, එතිහාර්ඩ් ගුවන් වාර 06ක්, කටාර් එයාර් ගුවන් වාර 35ක්, එයාර් අර්බියා ගුවන් වාර 11ක්, එයාර් ඉන්ඩියා 17ක්, ජසීරා එයාර් 04ක් ලෙස ගුවන් මෙහෙයුම් කටයුතු සිදු කරමින් තිබෙනවා. ඒ වගේම තවත් ගුවන් සමාගම් කිහිපයක් සිය මෙහෙයුම්වාර ශ්‍රී ලංකාව හරහා ආරම්භ කිරීමට එකඟතාව පළකර තිබෙනවා.

ඒ වගේම පලාලි අන්තර්ජාතික ගුවන්තොටුපලේ මෙහෙයුම් කටයුතු ඉතා සාර්ථක ලෙස ඉදිරියට කරගෙන යමින් තිබෙනවා. සතියකට තුන් වතාවක් පමණක් මදුරාසිය සහ පලාලි අතර පැවති ගුවන් මෙහෙයුම් මේ වන විට ගුවන් වාර 200 සම්පූර්ණ කර තිබෙනවා.



# තොරතුරුවල සත්‍යතාව තහවුරු කිරීමට විධිමත් යාන්ත්‍රණයක් අවශ්‍යද?

## විවෘත සහ වගකිවයුතු රජයක් සඳහා වන ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති, පාර්ලිමේන්තු මන්ත්‍රී ජගත් කුමාර

සත්‍ය අසත්‍ය භාවය තහවුරු කිරීම සඳහා රටේ සිදුවන සිදුවීම් පිළිබඳව නිසි සොයා බැලීමකින් තොරව අනිසි ලෙස විවිධ සමාජ මාධ්‍ය ඔස්සේ හුවමාරු වනවා. මේ නිසා රටතුළ ගැටුම් ඇතුළු සිදුවීම් රැසක් සිදුවෙනවා පමණක් නොව බොහෝ සමාජ තරාතිරම්වල පුද්ගලයන්ගේ කීර්තිනාමයට ද කැළලක් සිදු වනවා. මේ නිසා සමාජ මාධ්‍යවල පළවන පණිවිඩවල සත්‍යතාව තහවුරු කිරීමට නිසි යාන්ත්‍රණයක අවශ්‍යතාව මතුව තිබෙනවා.

පොලිසිය නිසි පරිදි රාජකාරි කරනවාද යන්න පිළිබඳවද මෙහිදී සාකච්ඡා වුණා. රට තුළ සිදුවන අපරාධ වැළැක්වීමට සහ මත්ද්‍රව්‍ය මෙරටට පැමිණීම වැළැක්වීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග සහ ක්‍රියාමාර්ග පිළිබඳවද මෙහිදී සාකච්ඡා කෙරුණා.

රට හදන්න යම් යම් උපක්‍රම යොදාගෙන අවංකව කටයුතු කළොත් අපිට මේ රට ගොඩනගන්න පුළුවන්. මාධ්‍යයත් නිසි වගකීමෙන් කටයුතු කරන්නේ නම් මේ රටට දැවැන්ත කාර්යයක් කිරීමට අවස්ථාවක් තිබෙනවා.

මෙම මාර්ගෝපදේශ මාලාව සකස් කරනු ලබන්නේ ජනාධිපති ලේකම් ප්‍රමුඛ සියලුම රාජ්‍ය නිලධාරීන්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, විද්වතුන්, ජනතාවගේත් අදහස් ලබාගෙනයි. මේ සමඟ සියලු පාර්ශ්ව තම වගවීම පිළිබඳව අවබෝධයක් ඇතිව වැඩ රාජකාරි සිදුකළ කළ යුතුයි. එසේ නොමැතිව දේශපාලනඥයන්ට පමණක් චෝදනා කළ පමණින් තුළින් රටක් ඉදිරියට ගෙන යන්න බැහැ.

රට ගොඩනැගීමට නම් යම් යම් උපක්‍රම වගේම, අවංකභාවයකින් වැඩ කිරීමටත් අවශ්‍යයි. එසේ කළහොත් මේ රට හදන්න පුළුවන්. මේ සඳහා මාධ්‍ය ආයතනවල සහායත් අවශ්‍ය කරනවා. මාධ්‍යයත් නිසි වගවීමකින් යුක්තව කටයුතු කළහොත් මේ රටට විශාල වැඩකොටසක් කරන්න පුළුවන් වගේම, රට හොඳ තැනකට ගෙන යෑමට හැකියාව තිබෙනවා.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතන ව්‍යුහය ශක්තිමත් කිරීමටත්, ජනතාවට වඩා හොඳ සේවාවක් ලබාදීමේ අරමුණින් මාර්ගෝපදේශ මාලාවක් සකස් කිරීමටත් පියවර ගන්නවා.

ඒ සඳහා සියලුම රාජ්‍ය නිලධාරීන්, ජනතාවගේ සහ දෙපාර්තමේන්තු විද්වතුන්ගේ අදහස් ලබාගැනීමට පියවර ගෙන තිබෙනවා.

රටේ සියලුම මැතිවරණවලදී ආබාධිත පුද්ගලයන්ට විවිධ ගැටලුවලට මුහුණ දීමට සිදු වනවා. ඔවුන්ට බාධාවකින් තොරව ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව සැලසීම සඳහා ඉදිරියේදී පැවැත්වෙන සියලුම මැතිවරණවලදී ආබාධ සහිත පුද්ගලයන් සඳහා විශේෂ හැඳුනුම්පත් ලබාදීම ඇතුළු විවිධ වැඩසටහන් අපි ක්‍රියාත්මක කරනවා.

ඒ වගේම ඡන්දය පාවිච්චි කරන තීන්ත පිටරටින් ගෙන්වන්නත් විශාල මුදලක් යනවා. ජාතික හැඳුනුම්පත දැන් අනිවාර්ය කර ඇති බැවින් ඡන්දය ප්‍රකාශ කිරීමේදී අක්‍රමිකතා සිදු විය නොහැකියි. එබැවින් මැතිවරණ වියදම් අඩු කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙළක් සකස් කළ යුතු බවද අප කමිටුව නිර්දේශ කළා.

මේ වන විට ජනතාව තමන්ට අවශ්‍ය සේවාවන් ලබා ගැනීමේදී විවිධ ගැටලුවලට මුහුණ දෙනවා.

එමෙන්ම ව්‍යාපෘති සඳහා අයථා ලෙස මුදල් වෙන් කිරීම සම්බන්ධයෙන් පසුගිය කාලය තුළ මෙම පළාත් සභාවලට මහජනතාවගෙන් විවිධ විවේචන එල්ල වුණා. රජයේ මුදල් නාස්ති කිරීම සම්බන්ධයෙන් ද චෝදනා එල්ල වුණා.

ඒ නිසා ඉදිරියේදී සංවර්ධන කටයුතු සඳහා පළාත් සභාවලට මුදල් ලබාදීමට නිසි නව වැඩපිළිවෙළක අවශ්‍යතාව මතුව තිබෙනවා. අපේ කණ්ඩායම ඒ ගැන සාකච්ඡා කරනවා.



# ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය වැළැක්වීමට ගෙන ඇති පියවර මොනවාද?

## කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීමේ රාජ්‍ය අමාත්‍ය ගීතා කුමාරසිංහ

ශ්‍රී ලංකාව තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය වැළැක්වීමේ වැඩසටහනක් ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමට නියමිත අතර ඒ සඳහා වැදගත් පනත් 03ක් වන ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතා පනත, කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභා පනත සහ කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත ගෙන ඒමට සූදානමින් සිටිනවා.

කාන්තාවන්ගේ සමාජ සුරක්ෂිතතාව සඳහා දිස්ත්‍රික්ක 10ක් ආවරණය වන පරිදි කාන්තා රැකවරණ මධ්‍යස්ථාන ඉදිකිරීමට සැලසුම් කර තිබෙනවා.

ඒ වගේම කාන්තාවන්ගේ ගැටලු ඉදිරිපත් කිරීමට 1938 දුරකථන අංකය පැය 24 ම සක්‍රීය ව ම පවතිනවා.

අත්හැර දමා යන දරුවන්ගේ සුරක්ෂිතතාව තහවුරු කිරීමට "කවුළුව" නමින් වැඩසටහනක් ද ක්‍රියාත්මකයි.

එක්සත් ජාතීන්ගේ අරමුදලේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වන මෙම වැඩසටහන ඉදිරි පස් වසර තුළ ක්‍රියාවට නැංවීමට නියමිත අතර ඒ යටතේ තරුණ කාන්තාවන්, වැන්දඹුවන්, බන්ධනාගාර ගත වූ පවුල්වල කාන්තාවන්, අඩු ආදායම්ලාභී නාගරික කාන්තා ව්‍යවසායකාවන් දිරි ගැන්වීම සඳහා ස්වයං රැකියා යෝජනා ක්‍රම ක්‍රියාත්මකයි.

මේ වන විට ගර්භණී සමයේ කිරි දෙන මවුවරු සඳහා මාස 10කට රු.45,000 පෝෂණ දීමනාවක් ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක වන අතර, 2023 වසරේ පෙර පාසල් ළමයින් සඳහා උදෑසන ආහාර වේලක් ලබාදීම වෙනුවෙන් ද වැඩසටහනක් ක්‍රියාත්මක කර තිබෙනවා.

සටහන
අසන්ත බණ්ඩාර

# රාජ්‍ය සේවයේ මාෆියාවලින් රටක් ගෙනයා නොහැක

පසුගිය මාස කිහිපය තුළ ශිශිර නිද්‍රාවට පත්ව සිටි වෘත්තීය සමිති (මාෆියා) ව්‍යාපාරය යළි අවදි වී ඇත. ඒ **"රාජ්‍ය සේවක වැටුප් වැඩි කරනු!"** යන සටන් පාඨය අතේ තබාගෙනය. කොහොමත් මේ ඒ අය අවදිවන සෘතුවකි. එළැඹෙන වසරේ රාජ්‍ය අයවැය යෝජනා ඉදිරිපත් කරන ආසන්නයේ මෙහම සිදුවීම සාමාන්‍ය කරුණකි. මෙය ඔවුන්ගේ සිල්ලර දේශපාලන ක්‍රියාකාරකම් අතර ජනප්‍රිය භාවිතයකි. ඒ මිස සැබෑ ලෙසම රාජ්‍ය සේවයේ උන්නතිය උදෙසා නොවන බව පැහැදිලි කරුණකි.

අප මෙසේ කියන්නේ අන් කිසිවක් නිසා නොව, යම් සේවාවක ගුණාත්මක භාවය මනිනු ලබන්නේ එම සේවාවේ නියුතු සේවකයින්ගේ වේතනය පමණක්ම නොවන නිසාය. දන්නා කාලය පුරාම රාජ්‍ය සේවාවේ අතිමහත් දූෂණ වංචා, අකාර්යක්ෂමතා, රාජ්‍ය සේවාව කෙළසීමත් රාජ්‍ය ආදායමටත් කර ඇති හානිය සුළු පටු නැත. රේගු දෙපාර්තමේන්තුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, සුරාබදු දෙපාර්තමේන්තුව ඇතුළු රාජ්‍ය ආදායමට වැඩි බරක් තබන සේවාවන්හී ඉහළ නිලතලවල වැජඹෙන උදවියගේ නොමනා ක්‍රියාකාරකම් හේතුවෙන් රාජ්‍ය ආදායමට එල්ල කර ඇති දැවැන්ත හානිය සම්බන්ධයෙන්වත් මේ වන තුරු මෙකී වෘත්තීය සමිති කිසිදු ප්‍රතිචාරයක් දක්වා නැත. ඔවුන් හැසිරෙන්නේ ඔවුන්ට එය අදාල නොමැති සේය.

එපමණක් නොව පසුගිය දිනවල දුම්රිය දෙපාර්තමේන්තු වෘත්තීය සමිති අවස්ථා කිහිපයකදී සුළු අභ්‍යන්තර ගැටළු හේතුවෙන් වැඩවර්ජනයක නියැලුණි. ආසන්නතම සිද්ධිය වූ පසුගිය ඔක්තෝබර් මස 04 වැනි දින වැඩවර්ජනයක් ආරම්භ කළේ ආරක්ෂක නිලධාරියෙකු හා දුම්රිය උප නියාමකවරයෙකු අතර ඇති වූ පුද්ගලික ගැටුමකි. මෙයට පදනම් වී තිබුණේ "සිගරට්ටුව"කි. කෙසේ වෙතත් මේ හේතුවෙන් සාමාන්‍ය දුම්රිය මගී ජනතාව බලවත් අපහසුතාවයට පත් වූ අතර, ඔවුන්ගේ අපහසුතාවයට වගකිව යුතු කිසිවෙක් නොවීය. මෙම නොමනා සිදුවීමට සම්බන්ධයෙන් වෘත්තීය සමිති මාෆියා කල්ලිය කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත් අතර, සිය කණගාටුව හෝ පළ කිරීමට තරම් නිහතමානී නොවීය.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මේ වන තුරුත් තමන්ට දී ඇති ඉලක්ක සපුරා නොමැති අතර, ආදායම් අය කිරීමට අදාලව සකස් කළ පරිගණක මෘදුකාංගය වසර අටක් ගතව ඇතත් මේ වන තුරුත් ක්‍රියාත්මක තලයට ගෙන ඒමට සමත්ව නැත. මෙම මෘදුකාංගය ක්‍රියාත්මක කිරීමෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ක්‍රියාවලිය විධිමත් වන අතර, සොරකම, වංචාව, දූෂණය හා ආකාර්යක්ෂමතාවය නැවැත්වීමට මෙමගින් මනා පිටුබලයක් ලැබේ. නමුදු සමස්ත පාලකයින්ගේ දූෂණ, වංචා, සොරකම් සම්බන්ධයෙන් පාරක් පාරක් ගානේ බෝඩ් ලෑලි උස්සමින් විරෝධය දක්වන මෙම වෘත්තීය සමිති මාෆියාව අද වන තුරු දේශීය ආදායම් දොපාර්තමේන්තුවේ ක්‍රියාවලිය විධිමත් කිරීම සම්බන්ධයෙන් කිසිදු හඬක් නඟා නැත. අවම වශයෙන් මේ සම්බන්ධයෙන් කිසිදු ප්‍රකාශයක් හෝ කර නැත.

සුරාබදු දෙපාර්තමේන්තුවට ද පසුගිය කාලය පුරා විවිධ චෝදනා එල්ල වූ අතර, සුරාබදු ආදායම් විධිමත් කිරීමේ අරමුණින් ක්‍රියාවට නන්වන ලද මත්පැන් බෝතල්වල ඇලවීමට යොදා ගන්නා ස්ටිකර් ක්‍රමවේදය පවා අවභාවිත කරමින් සුරාබදු දෙපාර්තමේන්තුවේ ඉහළ නිලධාරීන් විසින් අති දැවැන්ත වංචාවක් හා දූෂණයක් කර ඇති බවට ඔප්පු වී තිබේ. රේගු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් කිසිදු විවේකයක් නොගෙන පැය



විසි හතරේ සේවයේ යෙදුනු බව පවසමින් අති විශාල අතිකාල දීමනා ලබා ගැනීමක් සම්බන්ධයෙන් ද තොරතුරු වාර්තා විය. මෙකී වංචා, දූෂණ, සම්බන්ධයෙන් විරෝධයක් දැක්වීමට තබා නිවේදනයක් හෝ සිදු කිරීමට කිසිදු වෘත්තීය සමිතියක් මේ වන තුරුත් සමත් වී නැත.

රාජ්‍ය නිලධාරීන්ගේ මෙකී වංචා, දූෂණ, අකාර්යක්ෂමතා සම්බන්ධයෙන් වෘත්තීය සමිති මාෆියාවේ නිහඬතාවය මහත් පුදුමය දනවන තත්වයකි. පසුගිය අරගල සමයේදී තමන් තරම් අති පාරිශුද්ධ කිසිවෙකුත් නොමැති බව මහජනතාවට ඒත්තු ගන්වමින්, සමස්ත දේශපාලන අධිකාරියම අති දූෂිත බව හෙළි කිරීමට මෙම වෘත්තීය සමිති මාෆියාවන් නොගත් වෙහෙසක් නැත. ඒ සෑම අවස්ථාවකදීම ඔවුන් පුන පුනා පැවසුවේ මේ රටේ සංවර්ධනයට බාධාවක් වී ඇත්තේ පාලකයින්ගේ වංචාව, දූෂණය, නාස්තිය වැනි තත්වයන් බවයි. මෙය සම්පූර්ණ සත්‍ය නොව සත්‍යයෙන් අඩක් බව මේ වන විට පැහැදිලිය.

ලංකාව මුහුණ පා තිබෙන අර්බුදයන්ට ප්‍රධානතම හේතුව පාලක පැලැන්තියේ දුර්වලතා වන නමුත් ඊට නොදෙවෙනි ලෙස රාජ්‍ය සේවයේ ක්‍රියාකාරිත්වයත් ඒ සමඟම එකිනෙක හා බැඳී තිබේ. වඩාත් බරපතලම තත්වය වන්නේ මේ සම්බන්ධයෙන් වෘත්තීය සමිති මාෆියාව කිසිදු පියවරක් නොගැනීමයි. රාජ්‍ය කටයුතු කළ යුතු අන්දම පිළිබඳ අටුවා, ටීකා, ටිප්පනී සහිතව පාරක් පාරක් ගානේ, මයික් පලමින්, රූප පෙට්ටිවල එබෙමින් උපදෙස් දෙන වෘත්තීය සමිති තමන්ට අයත් ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ වංචා දූෂණ වැළැක්වීම සම්බන්ධයෙන් මුනිවත රැකීමම ඔවුන්ගේ තක්කඩිකමේ තරම කියාපායි.

තව නොබෝ දිනකින් විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිතය. එම විසර්ජන පනත් කෙටුම්පතට අදාල තීන්දු තීරණ මේ වන විට ගෙන අවසන් බව ඔය කියනා වෘත්තීය සමිති ව්‍යාපාරයන් ද දන්නා කරුණකි. නමුත් හදිසියේම රාජ්‍ය සේවක වැටුප් වැඩිවීමක් ඉල්ලා වෘත්තීය සමිති මාෆියාව විසින් විරෝධතා ක්‍රියාමාර්ග ගනු ලබන්නේ සත්‍ය ලෙසම රාජ්‍ය සේවකයින් කෙරේ ඔවුන් තුළ ඇති සද්භාවයෙන් නොවන බවත් පැහැදිලිය. අයවැය කරළියට පැමිණෙන සෑම අවස්ථාවකදීම වැටුප් වැඩිවීමක් ඉල්ලා විරෝධතා දැක්වීම වෘත්තීය සමිතිවල සම්ප්‍රදායකි. මේ මොහොතේ ද සත්‍ය ලෙසම රාජ්‍ය සේවකයින් කෙරේ හෝ රාජ්‍ය සේවාව භුක්ති විඳිනා සමස්ත මහජනතාව සම්බන්ධයෙන් උපන් අනුකම්පාවකින් මේවා කරනවා නොවේ.

මේ ඔවුන්ගේ බාල දේශපාලනයයි. මේ මොහොතේ වැටුප් වැඩි කරනා ලෙස රජයට බල කිරීමේ විරෝධතාවයක් නොදැක්වුවහොත් මෙම වෘත්තීය සමිති ව්‍යාපාරයන්ට ඉදිරියේදී ඔවුන්ගේ සිල්ලර දේශපාලනය ගෙන යාමට නොහැකි වනු ඇත. මෙය **"දැක්කොත් බුවා - නොදැක්කොත් එබුවා"** වැනි තත්වයකි. අයවැය ඉදිරිපත් කරනා කාලසීමාවේදී වැටුප් වැඩි කිරීමේ විරෝධතාවයක් දැක්වීමේදී යම් හෙයකින් රජය විසින් ප්‍රතිපත්ති තීන්දුවක් ලෙස වැටුප් වැඩිවීමක් කළ හොත් එය තමන්ගේ විරෝධතාවය නිසා රජයේ සේවකයින්ට ලබා දුන් සහනයක් ලෙස හුවා දක්වමින් ඉදිරියට දේශපාලනය කිරීමට වෘත්තීය සමිතිවලට හැකි වනු ඇත. එසේම යම් හෙයකින් රජය විසින් වැටුප් වැඩිකිරීමක් නොකළහොත් එය දඩමීමා කරගනිමින් ආණ්ඩු විරෝධී සටන් පාඨ කරළියට ගෙන ඒමටත්, ආණ්ඩු පෙරළීමේ ක්‍රියාමාර්ගවලට මෙම තත්වයන් යොදා ගැනීමත්, ඒ හරහා සිය සිල්ලර දේශපාලනය සිදු කිරීමටත් ඔවුන්ට හැකිය. එබැවින් වෘත්තීය සමිතිවල මෙම වැටුප් වැඩි කිරීමට කරනු ලබන විරෝධතා සිය අනාගත දේශපාලන ක්‍රියාකාරකම් වෙනුවෙන් සිදු කරනා සාම්ප්‍රදායික ක්‍රමවේදයක් මිස වෙනකක් නොවේ.

මේ වන විටත් වසර හතකින් රාජ්‍ය සේවය තුළ වැටුප් වැඩිවීමක් සිදුව නොමැති බව සත්‍යයකි. එමෙන්ම බරපතල වැටුප් විෂමතාවයක් රාජ්‍ය සේවය තුළ ක්‍රියාත්මක බව ද සත්‍යයකි. නමුත් ෂයිලොක් පන්නයෙන් වැටුප් ප්‍රශ්න විසඳිය නොහැකි බව සියලු දෙනා තේරුම් ගත යුතු සත්‍යයකි. මේ මොහොත යනු ලංකාව සුරපුරයක පහස විඳින තත්වයක නොවන බව අතීතය අමතක නැති සියලු දෙනා පිළිගන්නා කරුණකි. රාජ්‍ය සේවක වැටුප රුපියල් දහසකින් වැඩි කළත් ලක්ෂ පහළොවක් පමණ වන රාජ්‍ය සේවක පිරිස වෙනුවෙන් රජය වැය කළ යුතු මුදල රජයට දරාගැනීම අපහසුව බව අමුතුවෙන් කිව යුතු නැත.

තවමත් ලංකාව "බංකොළොත්" තත්වය ඉක්මවා ගොස් නැත. මෙය රාජ්‍යය පවත්වාගෙන යා නොහැකිව ජනාධිපතිවරයෙකු පළා ගිය රටකි. ආණ්ඩුවක් බලය අත්හැරි රටකි. රාජ්‍ය ආදායම් නොමැතිව, විදේශ සංචිත නොමැතිව තෙල්, ගෑස්, ආහාර, බෙහෙත් වැනි අත්‍යවශ්‍ය ද්‍රව්‍ය වෙනුවෙන් පෝළිම් ගැසී පෙළ සැදී සිටි රටකි. පෝළිම් තත්වය අවසන් කර තවමත් ඉකුත්ව ඇත්තේ වසරක පමණ කාලයකි. ඒ සඳහා කළ කැපකිරීම් අතිමහත්ය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ණය සහන ලබා ගැනීමට කළ යුතු දහංගැට සියල්ල දැමූවේය. නියමිත ආර්ථික ප්‍රතිසංස්කරණයන් පමා වීම නිසා මූල්‍ය අරමුදලේ දෙවන වාරිකය ලබා දෙන තුරු ඇඟිළි ගනිමින් සිටින්නට වී ඇති කාලයකි. තවමත් විදේශ ණය ආධාරයක් ඉල්ලුම් කිරීමේ හැකියාව නැත. විදේශ ආයෝජකයින් ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීම මඟහරිමින් සිටිනා කාලයකි. විදේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය කිරීම වෙනුවෙන් දිවා රෑ වෙහෙසන කාලයකි. විදෙස් සංචිත රැස් කිරීම වන්නේ ඉබි ගමනිනි. මේවා මෙසේ වීමටත් රාජ්‍ය සේවයේ ප්‍රමාදයන් සහ කඩාකප්පල් කිරීම් බලපා ඇත. මෙවන් තත්වයක් තුළ වෘත්තීය සමිති මාෆියාවන් හදිස්සියේම නින්දෙන් ඇහැරී සියලු රාජ්‍ය සේවකයින්ට රුපියල් විසිදහසක වැටුප් වැඩිවීමක් ඉල්ලා සිටී. රාජ්‍ය සේවකයන් පමණක් නොව ජීවන වියදම් ඉහළ යෑම මධ්‍යයේ සියළු පුරවැසියන් සිටින්නේ ආදායම් ප්‍රමාණවත් නොවීමේ අර්බුදයකය. ඒ අර්බුදය විසඳාලීම විය යුතුම නමුත් එක් එක් පාර්ශ්වික ඉල්ලීම් අනුව මේවා කළ හැකි නොවේ. රජය මේ මොහොතේ සිදු කරමින් සිටින්නේ සමස්ත අර්බුදය විසඳාලීමට සමත් ක්‍රම පද්ධතියක් සකස් කිරීමේ සංකීර්ණ සහ දුෂ්කර කටයුත්තකය.

ශ්‍රී ලංකාවේ සමස්ත රාජ්‍ය සේවකයින් ප්‍රමාණය ලක්ෂ 15ක් ආසන්නයට පැමිණ ඇත. 2022 වර්ෂය වන විට සමස්ත රාජ්‍ය සේවක ප්‍රමාණය දැක්වූයේ 14,91,622ක් ලෙසය. එම වසරේ රාජ්‍ය සේවක වැටුප් වෙනුවෙන් රුපියල් බිලියන් 420ක් වැය කර තිබිණි. මේ අනුව සමස්ත රාජ්‍ය සේවයට රුපියල් විසිදහසක දීමනාවක් වෙතොත් ඒ සඳහා මහා භාණ්ඩාගාරය විසින් අමතරව මාසිකව රුපියල් බිලියන 30ක් බැගින් වෙන් කළ යුතුය. එය වාර්ෂිකව බිලියන 360 කි. ඒ අනුව නව ඉල්ලීම් සමඟ බිලියන් 800ක් පමණ මේ වෙනුවෙන් වැය කිරීමට රජයට සිදුවෙනු ඇත. මේ මොහොත එවන් ප්‍රමාණයක අමතර පිරිවැයක් දැරිය හැකි ආර්ථික මට්ටමක ශ්‍රී ලංකාව පසුවේද යන්න සලකා බැලිය යුතුය. රාජ්‍ය බදු ආදායමෙන් අඩකට වැඩි කොටසක් මේ වන විටත් යොදා ගන්නේ වැටුප්, විශ්‍රාම වැටුප් වෙනුවෙනි. 2023 වසරේ පළමු කාර්තුවේ (මුල් මාස 3හි) රාජ්‍ය බදු ආදායම රුපියල් බිලියන 316 කි.

පසුගියදා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සමාලෝචන අවස්ථාවේදී ද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නියෝජිතයින් ප්‍රකාශ කර සිටියේ රජයේ වියදමට සාපේක්ෂ ඉපැයීම් සපුරාලීමට මෙතෙක් සමත්ව නොමැති බවකි. දෙවන වාරිකය ප්‍රමාද වීම කෙරෙහි මෙම ගැටළුව බරපතල ලෙස බලපා තිබිණි.

ඒ අනුව වෘත්තීය සමිති විසින් නැවත වරක් පාරට බැස උද්ඝෝෂණය කරමින් ඉල්ලා සිටින වැටුප් වැඩිවීම ප්‍රායෝගිකව කිසිසේත් ඉටු කළ හැකි නොවේ. ආදායම් නොමැතිව වියදම් වෙන් කිරීම ඉතිහාසය පුරාම අප විසින් කළ නොමනා ක්‍රියාකාරකමකි. ඒ වෙනුවෙන් වූ වන්දිය රාජ්‍ය සේවකයා පමණක් නොව සමස්ත ශ්‍රී ලාංකික ප්‍රජාව විසින්ම ගෙවමින් තිබේ. මේ නිසා රෑ වැටුණු වලේ මහ දවාලේත් නැවත නැවතත් අමාරුවේ වැටෙනවාද යන්න කල්පනා කළ යුතුය. මේ අමාරු මොහොතේ රාජ්‍ය සේවකයාගේ වගකීම යුතුකම විය යුත්තේ රජය ආරක්ෂා කරගෙන එය ස්ථාවර කිරීම වෙනුවෙන් වැඩකිරීමය. තමන් රජයෙන් පෙරළා බලාපොරොත්තුවන ප්‍රතිලාභයන් අත්පත් කරගත හැකිවනුවේ ඒ සාර්ථකත්වය මතය.

මේ අනුව අමතර ඉල්ලීම්වලට පෙර තමන් විසින් කළ යුතු වගකීම් යුතුකම් ප්‍රමාණය ඉටුකර තිබේද යන්න ගැන තහවුරුවක් තිබිය යුතුය. කළ යුත්ත නොකොට, නොමැති ලැබිය යුත්තක් ගැන ඉල්ලීම වෘත්තීය සමිතීන් මාෆියා වැඩක් ලෙස නම් කරන්නේ එබැවිනි.

මාෆියාවලින් රටක් පවත්වාගෙන යා නොහැකිය. මාෆියාකාරයින්ට උවමනා ලෙස රටක තීන්දු තීරණ ද ගැනීමට නොහැකිය. එබැවින් මාෆියාකාරයින්ගේ බොරු තර්ජනවලට රජය නැමුණහොත් නැවත පෝළිම් රාජ්‍යය මිස වෙන ප්‍රතිඵලයක් නම් රටට අත් නොවනු ඇත.

රිද්මා අනුරාධ ගමගේ

# මචං ජූඩ්



පත්තර පිටු පිළුණු වෙන්නට තිබූ යුගයක පත්තරය වාචික මුද්‍රිතයන් වෙත ඔසවා තබා පිළුණු භාවයෙන් මුදවාලූ විද්‍යුත් මෙහෙය වන්නා නුවන් ජූඩ් ලියනගෙ ʼය. නවීනත්වය මත කියවන සමාජයක මාධ්‍ය ජීවිතය ඇරියස් නොමැති කලාවක් පිළිබඳ කතා බහක් කරන්නේ නම් නුවන් ඇසුරු කිරීම තුළ එකී මාධ්‍ය කලාව උගත හැකිවනු ඇත. ඉතිහාසය ඉතිහාසයක් ලෙස උගෙන වර්තමානය සුහුරුව කියවා ගැනීම තුළ අනාගතය ගොඩ නගන දැනුමක් හෝ දැක්මක් ගොඩ නැගීමට නුවන්ගේ භාවිත මාධ්‍ය කලාව එතෙක් මෙතෙක් තුළ ගොඩ නැගූ මාධ්‍යවේදියා අතිශය වෙනස්ය. එහෙව් කලාකාමියෙකුගේ ජීවිතයේ කොටසක් කියවා විඳීම උදෙසා චැතම් ස්ට්‍රීට් ටී.වී. චැනලය මඟින් ශානුක කරුණාරත්න ‘මචං’ ජූඩ් සම්මුඛ වූ අවස්ථාව ශ්‍රව්‍ය දෘෂ්‍යව විඳ ගැනීමට සහෘද ඔබට අරයුම් කරමු.

*චැතම් ස්ට්‍රීට් යූ ටියුබ් නාලිකාව වෙනුවෙන් කළ “මචං” වැඩසටහනේ පසුගිය කොටස් නැරඹීමට මෙම QR කේතය Touch හෝ Scan කරන්න*

# මාලදිවයිනේ නව ජනාධිපති පත්වීම ඉන්දියානු චීන භූ දේශපාලනය උණුසුම් කරයි

මාලදිවයින් ජනාධිපතිවරණයෙන් මොහොමඩ් මුයිස් ලැබූ ජයග්‍රහණය එරට විදේශ ප්‍රතිපත්තියේ කැපිපෙනෙන වෙනසක් විය හැකි වීම පිළිබඳ සාකච්ඡාවක් මේ වන විට මතුව තිබේ. මෙම වෙනස ඉන්දියාව සහ චීනය සමඟ වන මාලදිවයින් රාජ්‍යතාන්ත්‍රික සහ භූ-දේශපාලන සබඳතා සඳහා සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකිය.

### මාලදිවයිනේ නව නායකත්වය

මොහොමඩ් මුයිස් සියයට 54 කට වැඩි ඡන්ද ප්‍රතිශතයක් ලබා ගනිමින් ජනාධිපතිවරණ ජයග්‍රහණය කළ අතර එය මාලදිවයිනේ කැපී පෙනෙන දේශපාලන වර්ධනයකි. ඔහුගේ ජයග්‍රහණය මෙම ඉන්දියානු සාගර දූපත් රාජ්‍යයේ අභ්‍යන්තර පාලනයේ පමණක් නොව විදේශ ප්‍රතිපත්තියේ ද වෙනස්කම් ඇති කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඔහු ලබන නොවැම්බර් 17 වනදා මාලදිවයිනේ නව ජනාධිපතිවරයා ලෙස දිවුරුම් දීමට නියමිතයි.

### ඉන්දියාව සහ චීනය සඳහා මාලදිවයිනේ වැදගත්කම

මාලදිවයින, ඉන්දියාවට සහ චීනයට උපායමාර්ගික වශයෙන් වැදගත් වේ. ඉන්දියාව සඳහා එය එහි බලපෑම් ක්ෂේත්‍රයේ කොටසක් ලෙස සලකනු ලබන අතර, එය මාලදිවයිනට මූල්‍ය ආධාර සහ යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා ආධාර කර ඇත. මීට ප්‍රතිවිරුද්ධව, චීනය හිටපු ජනාධිපති අබ්දුල්ලා යමීන්ගේ පාලන සමයේදී එහි belt and road initiative (BRI) කොටසක් ලෙස මාලදිවයින ඇතුළත් කළේය.

### ඉන්දියාවට අභියෝග

මාලදිවයිනේ ප්‍රගතිශීලී පක්ෂය ඇතුළත් මොහොමඩ් මුයිස්ගේ දේශපාලන සන්ධානය “ඉන්දියාව ඉවතට” (India Out) යන තේමාව ඔවුන්ගේ මැතිවරණ වේදිකාවන් මත ඉදිරියට ගෙන ඒමට කටයුතු කිරීම ගැන ඉන්දියාවට කණස්සල්ලක් තිබුණි. මුයිස්ගේ මතය, වෙළඳ සබඳතා නැවත සමතුලිත කිරීම සහ මාලදිවයිනෙන් ඉන්දීය හමුදා ඉවත් කිරීමය. මෙය ඉවත්ව යන ජනාධිපති ඊබ්‍රාහිම් මොහොමඩ් සෝලි විසින් ගන්නා ලද “”ඉන්දියාව පළමුව” (India First) යන ප්‍රවේශයට වෙනස් ය.



මේ අතර ඉන්දියාවේ විදේශ අමාත්‍යාංශයේ ප්‍රකාශක Arindam Bagchi, කලාපීය ආරක්ෂක අභියෝග සම්බන්ධයෙන් රටවල් සමීපව කටයුතු කිරීමේ අවශ්‍යතාව අවධාරණය කළේය. ඉන්දියාව මාලදිවයින සඳහා වැදගත් හවුල්කරුවෙකු වන අතර ජාතියේ ආර්ථික අභියෝගවලට මුහුණ දීම සඳහා මූල්‍ය ආධාරද විවිධ අවස්ථාවල ලබා දී ඇත.

### චීනයේ පුළුල් භූමිකාව

චීනය සිය belt and road initiative මුලපිරීම හරහා ඉන්දියානු සාගර කලාපයේ යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා ආයෝජනය කරයි. මාලදිවයිනේ මූලෝපායික පිහිටීම චීනයට ඒ කෙරෙහි උනන්දුවක් දක්වන අතර, චීනයේ බලශක්ති සැපයුම් සඳහා අත්‍යවශ්‍ය මාර්ගවලට එහි සමීපත්වය සැලකිල්ලට ගනී. කොහොම නමුත් දකුණු ආසියාවේ ඉන්දියාව සහ චීනය අතර වර්ධනය වන එදිරිවාදිකම් සඳහා මෙය කිසියම් ප්‍රමාණයකට මේ වන විට දායක වී තිබේ.

### නව ජනාධිපතිවරයාගේ තුලනය

ඒ අනුව මොහොමඩ් මුයිස්ගේ තේරී පත්වීම, කලාපය තුළ ඉන්දියා-චීන එදිරිවාදිකම් තීව්‍ර කිරීමක් පිළිබද අදහසක් මතු කර ඇත. ඉන්දීය හමුදා ඉවත් කරගැනීම වැනි සංකේතාත්මක ක්‍රියාමාර්ග තිබිය හැකි වුවද, නව මාලදිවයින් පරිපාලනය ඉන්දියාව සහ චීනය යන දෙඅංශයෙන්ම යහපත් සබඳතා පවත්වා ගැනීමට ප්‍රමුඛත්වය දෙනු ඇතැයිද දේශපාලන නිරීක්ෂකයන්ගේ මතයය. ප්‍රවීණයන් විශ්වාස කරන්නේ “ඉන්දියාව අවුට්” ප්‍රතිපත්තිය ස්ථාවර විදේශ ප්‍රතිපත්ති අභිප්‍රායයකට වඩා ඡන්ද ලබා ගැනීමේ දේශපාලන උපාය මාර්ගයක් බවයි.

පළපුරුදු ඉන්දියානු රාජ්‍ය තාන්ත්‍රිකයෙකු වන අනිල් වාද්වා පවසන්නේ මුයිස්ගේ ජනාධිපති ධුරය ඉන්දියාවට ගැටළු ඇති කළ හැකි නමුත් ඉන්දියාව වසර ගණනාවක් තිස්සේ මාලදිවයිනේ ශක්තිමත් සබඳතා ඇති කරගෙන ඇති හෙයින් නව රජයෙන් එය අභියෝගයට ලක් නොවන බවයි.

### ඉදිරි මාවත

මොහොමඩ් මුයිස්ගේ පරිපාලනය ආරම්භ වන විට මාලදිවයින, ඉන්දියාව සහ චීනය අතර වර්ධනය වන සබඳතා පිළිබඳව විමසිල්ලෙන් සිටීම අත්‍යවශ්‍ය වනු ඇත. භූ-දෙශපාලන නොසන්සුන්තාවය ඉහළ මට්ටමක පවතින බැවින් මාලදිවයිනේ නායකත්වය අවශ්‍යතා සමතුලිත කිරීමේ සහ ස්ථාවර පාලනයක් සහතික කිරීමේ සියුම් අභියෝගයකට මුහුණ දෙනුද ඇත. එය රාජ්‍ය තාන්ත්‍රිකභාවය, උපායමාර්ගික චින්තනය සහ ඊට සම්බන්ධ සියලු පාර්ශ්වයන්ගෙන් දූරදාක්නා ක්‍රියාමාර්ග අවශ්‍ය වන තත්ත්වයකි.

ඉන්දියානු සාගර කලාපයේ භූ දේශපාලනය සංකීර්ණ ප්‍රහේලිකාවක් වන අතර මාලදිවයිනේ විදේශ ප්‍රතිපත්තියේ මීළඟ පරිච්ඡේදය මෙම ප්‍රධාන පාර්ශවයන් අතර ගතිකත්වයට සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ද නොඅනුමානය.

නිරෝෂන් පෙරේරා

# මිනිසා අත්හැර විසඳුමක් නැත



ගැටුම් නිරාකරණය වෙනම හැදැරිය යුතු විෂයක්. මානව වර්ගයාගේ ඉතිහාසය කියන්නෙම ගැටුම්වල ඉතිහාසයක් වී තිබීමත් ඒක වර්තමානයේදීත් අනාගතයේදීත් එලෙසම පවතිනු ඇති බවට තිබෙන නිසැක බවත් නිසා ගැටුම් නිරාකරණයට විද්‍යාවක් තිබීම මූලික මිනිස් වුවමණාවක් වන තරමට අවශ්‍යතාවයක්. ඒක කොහොම වුණත් විද්‍යාවක් තිබීම ප්‍රමාණවත් නැහැ. ඒක භාවිතාවේ යෙදීමත් වෙන්න ඕන. විශේෂයෙන්ම අනාගතයේ දී ඇති වෙන්න පුළුවන් ගැටුම් වලක්වා ගැනීමට පුළුවන් වෙනවා නම් ඒක මානව වර්ගයා ලබන විශාලම ජයග්‍රහණයක්. මොකද අද මේ වෙමින් තියෙන ගැටුම් හින්දම ලෝකයේම මානව වර්ගයා මුහුණ දෙන ඛේදවාචක, මේකේ වැදගත්කම ලොකුවටම අවධාරණය කරලා තියෙන නිසා.

රටවල් අතර වගේම රට අභ්‍යන්තරයේ ප්‍රශ්න විසඳ ගන්න ගැටුම් නිරාකරණ විධික්‍රම තියෙනවා. විශේෂයෙන්ම බාහිර බලවේග රටකට කරන බලපෑම නිසා සිදු විය හැකි අනතුරුවලින් වලක්වා ගැනීමට නම් ගැටුම් නිරාකරණය ගැන පරිචයක් ඇති බුද්ධිමත් රාජ්‍ය නායකත්වයකත් වගේම බුද්ධිමත් ජනතාවක් ඉන්න ඕන.

ශ්‍රී ලංකාවේ ඉතිහාසය ගත්තත් හැම පරම්පරාවක්ම දරුණු ගැටුම්කාරීත්වයකට මුහුණ දීලා තියෙනවා. ඒ බාහිර බලවේගවල හෝ රට අභ්‍යන්තරේ ගැටළු නිසා. ඒත් මේ ගැටුම් වලක්වා ගැනීම වෙනුවෙන් තිබුණේ ගොඩක් දුර්වල තත්වයක් කියන එකනම් රහසක් නොවෙයි. මේවා අවසන් වුණේ මළ කඳන් ගොඩගැසීමෙන්. රාජ්‍ය දේපොළ විනාශ කරගෙන. ශිෂ්ඨ සම්පන්න රටක් නම් ඒක එහෙම වෙන්න ඕන නැහැ. ගැටුම නිවැරදි විදිහට කළමනාකරණයටත් අනාගතයේදී සිදුවිය හැකි තත්වයන් පාලනය කරගන්නත් ඒවාට නිවැරදි ක්‍රියාමාර්ග ගන්න පුළුවන් වෙන්න ඕන. ඉතිං එහෙම කාලයක් දැන් ගෙවෙමින් තිබෙනවා කියලා හිත්නන් පුළුවන් දේවල් පහුගිය ටිකේ සිදුවුණා. රට බංකොලොත් වුණැයින් පස්සේ ආපහු දේවල් ගොඩගන්න ඕන කරන දේවල් ගොඩක් සිදු වුණේම අනාගතය ගැන ගොඩක් දුර කල්පනා කරලා. මේකෙදි රටෙන් බාහිර බලවේග ගැනත් සෑහෙන අවධානයක් ජනාධිපති රනිල් වික්‍රමසිංහ දක්වලා තිබුණා.

CHATHAM HOUSE

ජනාධිපතිවරයා පසුගිය කාලය පුරාම ජාත්‍යන්තර වශයෙන් පෙනී සිටියේ ගෝලීය අර්බුදවලින් වෙන්න පුළුවන් බලපෑම මග හැරලා, මේ රටෙත් ඉන්දියානු සාගර කලාපයේත් සාමයත් සමෘද්ධියත් සහතික කරගන්න වැඩක. ආපහු ලෝක බලවතුන්ගේ භූ-දේශපාලනික මෙහෙයුම්වල ගොදුරක් බවට මෙම කලාපය පත්වීමේ අවදානමක් මතුවෙලා තියෙනවා. ඒක වලක්වා ගැනීම ලෝක බලවතුන්ගේ අභිප්‍රාය විය යුතු බව ජනාධිපතිවරයා නිරන්තරයෙන් හඬ නැගීමක් කළා.

මේ ජාත්‍යන්තර මෙහෙයුමේ අගය බොහොමයක් අය ඒ බරින් තේරුම් ගත්තේ නැති වුණත් අද වෙන කොට ඊශ්‍රායල්-පලස්තීන ගැටුම නිසා පොදුවේ ලෝකයේ සියලුම රාජ්‍යයන්ට වන නරක බලපෑම තේරෙන්න පටන් අරගෙන තියෙනවා.


පලස්තීනයට විසඳුමක් දෙන්න ලෝක බලවතුන් අසමත් කියලා රනිල් කිව්වේ මේ යුද්දේ පටන් ගන්නත් සති ගානකට කළින්. අලුත් නිර්මාණාත්මක විසඳුම් නැතිව ලෝකයට ඉස්සරහට යන්න බැරි බවත් කිව්වා. විසඳුම් හොයාගන්න බලවත් අය එක මේසයකට ඇවිත් කතාකරන්න කියලත් කිව්වා. එතකොට ජනාධිපති රනිල්ගේ විසඳුම වෙන්නෙත් හැම දෙනාගෙම එකඟතාවය, සහයෝගය අනුව දේවල් බෙදාහදාගෙන යන සාමකාමී ගමනක්. රනිල් මේ දකුණු ආසියානු කලාපයෙත්, ඉන්දියන් සාගරයට මායිම්ව තිබෙන සියළු රටවලත් ගැටුම් නිරාකරණයට යෝජනා කරන්නෙත් ඒක.

දකුණු ආසියානු කලාපය කියන්නේ යුධ ගිනි ඇවිල ගොඩක් වදවේදනාවලට මුහුණ දීපු පැත්තක්. ත්‍රස්තවාදය, දේශපාලන අර්බුද, ආර්ථික අර්බුදය කලාපයට ආවේනිකයි. සමහර විරසකයන්, කඩා වැටීම් මේ වෙද්දි යටපත් වෙලා තිබුණට මේවා අළු යට ගින්දර. මොකක් හරි සිද්ධියකින් නැති නම් බාහිර බලපෑමකින් මහා ගිනි ජාලාවන් වෙන්න පුළුවන්.

මේ හින්දා කලාපීයේ රටවල් අතර සහයෝගිතාව වර්ධනය කරගෙන එකිනෙකා අතර විශ්වාසය අවබෝධය එක්ක, එකට යන ගමනක් අරමුණු කරගත්ත කලාපීය එකමුතුවක වැදගත්කම ජනාධිපතිවරයා දිගටම පෙන්වා දෙන කාරණයක්.

අද බුර බුරා ඇවිලෙන පලස්තීන ඊශ්‍රායල් ගැටුම කියන්නෙත් ඒ කලාපීය විරසකයේ අර්බුදයක් කියලා තේරුම් ගත්තත් වැරදි නැහැ. මේ ගැටුමට ලොකු ඉතිහාසයක් තියෙනවා වගේම ලෝක බලවතුන්ගේ බලපෑම් නිසා සිදු වෙච්ච අලකලංචි ගොඩක් තියෙනවා. ජාතිය, ආගම, භූමිය පටලවා ගනිමින් මේ අර්බුදකාරී ඉතිහාසය ගොඩනැංවුණා වගේම අදත් විසඳුම් හොයන්න යන්නේ මේ පරණ සංකල්ප ආරක්ෂා කිරීම එක්ක. ඒත් 'මිනිසා' කියන වස්තුව අත්හැරලා. ඉවක් බවක් නැතිව ඝාතන සිදුවෙන්නේ ඒ නිසා. ජනාධිපති රනිල් යෝජනා කරන්නේ අලුත් වෙමු කියලා. මිනිසාව රැකගැනීම පළමුව විය යුතුයි කියලා.

ලොකු












පිටකෝට්ටේ, මිෂන් පාර, අංක 19/5/ඒ දරණ ස්ථානයේ පදිංචි කේ.පී.අයි. ප්‍රියංගනී වන මා විසින් උඩහමුල්ල, විජේරාම මාවගේ පිහිටි TDL මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී